සෞඛ්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

ர்றஹஜஹஉ மஇகரஷர்

,யதஷஇற ஜபஉபந்கஹஆ றகஷகடப

Ministry of Health

Sri Lanka Thriposha Ltd.

ත්‍රිපෝෂ
THRIPOSHA
திரிபோஷ











වාර්ෂික වාර්තාව
ஆண்ட றிக்கை
Annual Report

2018

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

වාර්ෂික වාර්තාව - 2018

පෙළගැස්ම **පිටුව**

1. අපගේ දැක්ම සහ මෙහෙවර 01 - 02

2. සභාපතිතුමාගේ පණිවිඩය 03

3. අධ්‍යක්ෂ මණ්ඩලය 04

4. සමාගම කෙටියෙන් හඳුනා ගනිමු 05

5. විගණන හා කළමනාකරන කමිටුව සහ ප්‍රසම්පාදන කමිටු 06

6. ත්‍රිපෝෂ ආයතනයේ ඉතිහාසය හා වර්තමාන ප්‍රගතිය 07

7. මානව සම්පත් විශ්ලේෂණය 08 - 09

8. සැපයුම්කරුවන් පිළිබඳ විස්තර 10

9. නිෂ්පාදන තොරතුරු හා අපේක්ෂිත ඉලක්කය 10 - 13

10. ත්‍රිපෝෂ බෙදාහැරීමේ ක්‍රියාවලිය සහ තොරතුරු 14 - 17

11. අළෙවි අංශය 18 - 19

12. 2018 වර්ෂය තුළ අත් කරගත් ජයග්‍රහන, මුහුනදුන් අභියෝග,
2019 වර්ෂයේ සාර්ථකත්වය වෙනුවෙන් යෝජනා සහ අපේක්ෂිත ඉලක්ක 19 - 21

13. අවසන් ඉලක්කය 22

14. ස්තුතිය 23

15.වාර්ෂික මූල්‍ය ප්‍රකාශය 24 - 46

16. විගණකාධිපති වාර්තාව 47 - 55

අපගේ දැක්ම

ශ්‍රී ලාංකේය ප්‍රජාව

මන්දපෝෂණයෙන් තොර, නිරෝගීමත්,

සෞභාග්‍යමත් සහ අභිමානවත්

ජාතියක් බවට පත් කිරීම

අපගේ මෙහෙවර

සියළු පෝෂණගුණ සපිරි ත්‍රිපෝෂ

අතිරේඛ ආහාරය සෞඛ්‍යාරක්ෂිතව

නිපදවා ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත

නොමිලේ ලබාදෙමින් නිරෝගිමත් ජනතාවක්

බිහිකිරීමේ ජාතික මෙහෙවරට දායකවීම සහ

සමස්ට ශ්‍රී ලාංකේය ප්‍රජාවගේ පෝෂණ

අවශ්‍යතාවය සපුරාලීම සඳහා පෝෂණීය

අතිරේඛ ආහාර වෙළඳපොළට හඳුන්වාදීමත්,

එසේම මෙම සියළුම නිෂ්පාදනයන් සඳහා

ප්‍රධාන අමුද්‍රව්‍ය සැපයුම්කාරක දේශීය ගොවියා

බලගැන්වීමද අරමුණුවේ

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි සභාපතිතුමාගේ පණිවිඩය



සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ පූර්ණ රජය සතු සමාගමක් ලෙස 2011 වර්ෂයේදී ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම සංස්ථාගත කිරීමේදී සංස්ථාවලියේ දක්වා ඇති අරමුණුවලින් ප්‍රධානතම අරමුණ පෝෂණයෙන් සපිරී නිරෝගිමත් ජනතාවක් බිහි කිරීමේ ජාතික මෙහෙවර ඉටු කිරීම උදෙසා ත්‍රිපෝෂ අතිරේක ආහාරය නිෂ්පාදනය කොට සෞඛ්‍ය සායන මගින් ශ්‍රී ලංකාවේ වෙසෙන සියළුම ගර්භනී මව්වරුන්, කිරිදෙන මව්වරුන් හා වයස අවුරුදු 05ට අඩු, බර අඩු දරුවන් උදෙසා නොමිලේ බෙදා හැරීම වූ අතර 2015 වසර මා භාර ගත් දින සිට මේ වසර වන විට එම ඉලක්කය සැපිරීමට හැකි විය.

එමෙන්ම සංස්ථාවලියේ තවත් ප්‍රධානතම අරමුණක් වූයේ වෙළඳපල වෙත වාණිජ නිෂ්පාදන (Commercial Products) හඳුන්වා දී රජය මත යැපෙන ආයතනයක් නොවී රජයට ආදායම් උපයන ආයතනයක් බවට පත් වීමයි. සුපෝෂ නිෂ්පාදනය වෙළඳපොළට හඳුන්වාදී ලාභ ඉපයීමෙන් මෙම අපහසු ඉලක්ක දෙකම වසර තුනක් වැනි ඉතා කෙටි කාලයක් තුළ ජයග්‍රහණය කිරීමට මා හට හැකි වූ බව ඉතා සතුටින් ප්‍රකාශ කරමි.

ඒ සඳහා නන් අයුරින් සහයෝගය දැක්වූ අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා, ගරු සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමා, අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සමස්ත සේවක මණ්ඩලය හා අඛණ්ඩ නිෂ්පාදනයක් උදෙසා නිසිකලට අමුද්‍රව්‍ය සපයන අපගේ සැපයුම්කරුවන් හා අපහට නන් අයුරින් සහය දක්වන සියළු දෙනා කෘතඥ පූර්වකව සිහි කරමි.

එම්. ඩී. බන්දුසේන
සභාපති
ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
අධ්‍යක්ෂ මණ්ඩලය - 2018

- සභාපති, එම්. ඩී. බන්දුසේන මහතා

- අධ්‍යක්ෂ, වෛද්‍ය අනිල් ජාසිංහ මහතා
  සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා, වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මිය
  ප්‍රජා වෛද්‍ය විශේෂඥ
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා, නිතිඥ එච්. එම්. චමින්දිකා හේරත් මෙනවිය
  නීති නිළධාරිණී
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා, තේජා හේරත් මහත්මිය
  ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරිණී
  කාර්මික තාක්ෂණ ආයතනය

- අධ්‍යක්ෂිකා, වෛද්‍ය දමයන්ති හපුගොඩ මහත්මිය
  ළමා රෝග විශේෂඥ
  පානදුර මහ රෝහල

- අධ්‍යක්ෂ, දර්ශන විජේසිරිවර්ධන මහතා
  ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
  මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

- නිරීක්ෂක, එම්. ටී. ආර්. සී චිත්‍රලතා මහත්මිය
  ප්‍රධාන ගණකාධිකාරී
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- තනූජා ප්‍රියදර්ශනී අල්විස් මහත්මිය
  අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ත්‍රිපෝෂ ආයතනය කෙටියෙන් හඳුනා ගනිමු

- **ලිපිනය** - තැ.පෙ. 17, කොළඹ පාර,
  කපුවත්ත, ජා-ඇල
- **දුරකථන** - 0112 - 236588
  0112 - 237418
  0112 - 233451
- **ෆැක්ස් අංකය** - 0112 - 237363
- **ඊ-මේල් ලිපිනය** - **thriposha@gmail.com**
- **අමාත්‍යාංශය** - සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා
  අමාත්‍යාංශය
- **ආයතනයේ ස්වභාවය** - සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින පූර්ණ
  රාජ්‍ය සමාගමකි
- **සමාගම් ලියාපදිංචි අංකය** - PB /3873
- **ප්‍රධාන නිෂ්පාදනය** - නොමිලේ ලබා දෙන පෝෂණ ගුණයෙන් හා
  සෞඛ්‍යයෙන් පිරිපුන් ත්‍රිපෝෂ අතිරේක ආහාරය
  හා අලෙවිය සඳහා සුපෝෂ
- **ත්‍රිපෝෂ බෙදා හැරීමේ මධ්‍යස්ථාන** -
  * දිවයින පුරා ඇති සෞඛ්‍ය වෛද්‍ය
    මධ්‍යස්ථාන
  * වතු
  * පරිවාස හා ළමා රක්ෂණ මධ්‍යස්ථාන
- **සුපෝෂ නියෝජිතායන**
- **බෙදා හරිනු ලබන ආකාරය** - දුම්රිය වැගන් හා ලොරි රථ මගින්
- **ප්‍රතිලාභීන්** -
  * සියලුම ගර්භනී හා කිරිදෙන මව්වරුන්
  * මව්වරුන්
  * පෝෂණ අවශ්‍යතා සහිත ළමුන්
  * ඇතැම් රෝගීන්
- **මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව** - දශ ලක්ෂය ඉක්මවා ඇත
- **බැංකුව** - ලංකා බැංකුව
- **විගණක** - විගණකාධිපති
  ජාතික විගණන කාර්යාලය
  අංක 306/72, පොල්දූව පාර
  බත්තරමුල්ල

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
විගණන හා කළමනාකරණ කමිටුව - 2018

- දර්ශන විජේසිරිවර්ධන මහතා
  සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මිය
  සාමාජික - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂිකා - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- නිතිඥ එච්. එම්. චමන්දිකා හේරත් මෙනවිය
  සාමාජික - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂිකා - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- එන්.එන්.කේ. දිවාකර මිය
  නිරීක්ෂක - විගණන හා කළමනාකරණ කමිටුව
  විගණන අධිකාරි - ජාතික විගණන කාර්යාල

- එන්. එල්. ජයසිංහ මහත්මිය
  සහකාර ගණකාධිකාරී
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- එල්. පේ. එස්. ප්‍රේමචන්ද්‍ර මහතා
  කැඳවුම්කරු - විගණන හා කළමනාකරණ කමිටුව

  අභ්‍යන්තර විගණක - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව
(රුපියල් මිලියන 100 දක්වා)

- සභාපති
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- සී.බී.එස්.අයි. පෙරේරා මිය
  ගණකාධිකාරී (මුදල්) වැය - 1
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- වෛද්‍ය රසාංජලි හෙට්ටිආරච්චි මිය
  අධ්‍යක්ෂ (පෝෂණ සම්බන්ධීකරන ඒකකය)
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- ඒ.එල්. බස්නායක මයා
  අධ්‍යක්ෂ (විභාග)
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- දමිතා රත්නායක මිය
  අධ්‍යක්ෂ - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

සුළු ප්‍රසම්පාදන කමිටුව
(රුපියල් මිලියන 10 දක්වා)

- ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්)
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී (මානව සම්පත් හා නිති)
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- සහකාර ගණකාධිකාරිණී
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

ත්‍රිපෝෂ ආයතනයේ ඉතිහාසය හා වර්තමාන ප්‍රගතිය

ඉතිහාසය

1973 වර්ෂයේදී සෞඛ්‍ය අමාත්‍යාංශය සහ කෙයා සංවිධානය සමග ඇති කරගත් ගිවිසුමක් මත ඇමෙරිකාවෙන් ත්‍රිපෝෂ ආනයනය කර ශ්‍රී ලංකාව තුලදී පැකට් කර ඉලක්කගත ප්‍රතිලාභීන් අතට පත් කරන ලදි.

1979 වර්ෂයේදී ටෙන්ඩර් කැඳවීමෙන් ලංකා දුම්කොළ සමාගමට ත්‍රිපෝෂ වැඩසටහනේ කළමණාකාරිත්වය පවරන ලද අතර 1987 වර්ෂයේදී කෙයා ආයතනය සම්පූරණයෙන්ම මෙම වැඩසටහනෙන් ඉවත් වන ලදි. 1987 සිට 2010/09/17 දින දක්වා ලංකා දුම්කොළ සමාගම විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ කළමනාකාරිත්වය පවත්වාගෙන යන ලදි.

රටේ මන්දපෝෂණය තුරන් කරලිමේ ජාතික වැඩසටහන වඩාත් සවිබල ගැන්වීමේ අරමුණින් ත්‍රිපෝෂ වැඩසටහන කැබිනට් මණ්ඩල තීරනයක් මගින් 2010/09/17 වන දින 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් නමින් පූර්ණ රජය සතු සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදි.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විතව සංස්ථාපනය කරන ලද සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම පූර්ණ වශයෙන් කළමනාකාරිත්වය භාරගෙන කටයුතු කිරීම 2011/01/01 දින සිට ආරම්භ විය.

වර්තමාන ප්‍රගතිය

2010 වර්ෂයේ රජයට පවරා ගන්නා අවස්ථාවේදි ශ්‍රී ලංකාව තුළ ත්‍රිපෝෂ ලැබීමට හිමිකම ඇති සම්පූර්ණ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 928,000ක් විය. මෙම ප්‍රතිලාභීන් සඳහා සම්පූර්ණයෙන් මසකට අවශ්‍ය ත්‍රිපෝෂ සැපයීමට ත්‍රිපෝෂ මෙ.ටො. 1,392ක් නිෂ්පාදනය කළ යුතු විය. නමුත් මාසික නිෂ්පාදනය මෙ.ටො. 725ක් වූ අතර එය සමස්ට අවශ්‍යතාවයෙන් 52% කි.

2018 වර්ෂයේ සමස්ට ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,071,946ක් වන අතර මසකට අවශ්‍ය කරන ත්‍රිපෝෂ ප්‍රමානය මෙ.ටොන් 1,607කි. මාසික නිෂ්පාදනය මෙ.ටොන් 993ක් වන අතර එය මුළු අවශ්‍යතාවයෙන් 62%කි.

මෙම වර්ෂයේ නිෂ්පාදනය කරන ලද සුපෝෂ ප්‍රමානය මෙ.ටො. 2,607කි. සුපෝෂ අලෙවි ආදායම රු මිලියන 523ක් වන අතර මින් රු මිලියන 369ක් පිටිවැය ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයට ගෙවා ඇත.

මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත සේවා ගණන, තනතුරු හා අනුමත සේවක සංඛ්‍යාව

01	**ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්**		
	• ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්)	01	
	• ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති)	01	02
02	**මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්**		
	• කළමනාකරු (ඉංජිනේරු හා නිෂ්පාදන සේවා)	01	
	• කළමනාකරු (තත්ත්ව පාලන)	02	
	• කළමනාකරු (මුදල්)	01	
	• කළමනාකරු (අලෙවි ප්‍රවර්ධන)	01	05
03	**කනිෂ්ඨ කළමනාකරුවන්**		
	• බෙදාහැරීමේ නිළධාරි	01	
	• අභ්‍යන්තර විගණක නිළධාරි	01	
	• මුදල් නිළධාරි	01	
	• සැපයීම් නිළධාරි	01	
	• ගබඩා නිළධාරි	01	
	• ගුදම් ගබඩා නිළධාරි	01	
	• නිෂ්පාදන නිළධාරි	03	
	• පරිපාලන නිළධාරි	01	
	• ගිණුම් නිළධාරි	01	
	• ඉංජිනේරු සේවා නිළධාරි	01	12
04	**කළමනාකරණ සහකාර (තාක්ෂණ)**		04
05	**කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)**		18
06	**ප්‍රාථමික සේවා**		
	ප්‍රාථමික සේවා (ශිල්පීය)		
	• රියදුරු	07	
	• විදුලි කාර්මික	04	11
	ප්‍රාථමික සේවා (අර්ධ ශිල්පීය)		
	• බොයිලේරුකරුවන්	03	
	• පිටර්වරුන්	03	
	• ලේත් යන්ත්‍රකරුවන්	02	
	• යන්ත්‍ර ක්‍රියාකරු	28	
	• තත්ත්ව පරීක්ෂක	07	
	• ගිනි නිවීමේ උපස්ථායක	01	
	• ෆෝක්ලිෆ්ට් යන්ත්‍ර ක්‍රියාකරු	02	46
	ප්‍රාථමික සේවා (ශිල්පීය නොවන)		
	• උද්‍යානකරු	02	
	• කම්කරු/කාර්යාල සහායක	02	
	• සාමාන්‍ය කම්කරු	129	
	• කම්කරු පාලිකා	01	134
	එකතුව		232

අපගේ කණ්ඩායම සේවා අනුව විහිදී ඇති ආකාරය මෙසේය

- **නිෂ්පාදනාගාරය**

(කණ්ඩායමට ඇතුළත් පිරිස 205)

	තනතුරු	සංඛ්‍යාව
01	ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්)	01
02	කළමනාකරු (ඉංජිනේරු සේවා හා නිෂ්පාදන)	01
03	කළමනාකරු (තත්ත්ව ආරක්ෂක)	02
04	ගුදම් ගබඩා නිළධාරී	01
05	නිෂ්පාදන නිළධාරීන්	03
06	ගබඩා නිළධාරීන්	01
07	බෙදාහැරීමේ නිළධාරීන්	01
08	ඉංජිනේරු සේවා නිළධාරී	01
09	කළමනාකරණ සහාකාරවරුන්	14
10	විදුලි කාර්මිකයින්	04
11	ගිනි නිවීමේ උපස්ථායකයින්	01
12	ෆෝක්ලිෆ්ට් යන්ත්‍ර ක්‍රියාකරු	02
13	තත්ත්ව පරීක්ෂකයින්	07
14	යන්ත්‍ර ක්‍රියාකරුවන්	28
15	ලේත් යන්ත්‍රකරුවන්	02
16	පිටර්වරුන්	03
17	බොයිලේරුකරුවන්	03
18	සාමාන්‍ය කම්කරුවන්	130
	එකතුව	**205**

- **පරිපාලන, ගිණුම් හා වෙනත් අංශ**

(කණ්ඩායමට ඇතුළත් පිරිස 27)

	තනතුරු	සංඛ්‍යාව
01	ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති)	01
02	කළමනාකරු (මූල්‍ය)	01
03	කළමනාකරු (අලෙවි ප්‍රවර්ධන)	01
04	මුදල් නිළධාරී	01
05	ගිණුම් නිළධාරී	01
06	අභ්‍යන්තර විගණන නිළධාරී	01
07	පරිපාලන නිළධාරී	01
08	සැපයුම් නිළධාරී	01
09	කළමනාකරණ සහාකාරවරුන්	08
10	රියදුරන්	07
11	කාර්යාල සහායක	02
12	උද්‍යානකරු	02
	එකතුව	**27**

2018 වර්ෂයේ සැපයුම්කරුවන් පිළිබඳ විස්තර

සෝයා බෝංචි හා බඩඉරිඟු

සි/ස එස්. ඩී. කේ. යුනයිටඩ් ඇග්‍රිවෙන්චස් (පුද්ගලික) සමාගම
පන්ඩුලගම
අනුරාධපුර

කිරි පිටි

මිල්කෝ සමාගම
නො: 45
නාවලපාර
නාරාහේන්පිට

විටමින්

සි/ස ජේ.කේ. ට්‍රේඩිලින්ක් (පුද්ගලික) සමාගම
නො: 44
තලවතුගොඩ පාර
වීටකෝට්ටේ

මිනරල්

සි/ස වික්‍රමරත්න (පුද්ගලික) සමාගම

ක්‍රාෆ්ට් පෙපර් බෑග්

සි/ස අබිදුල්ලා ඉන්ඩ්‍රස්ට්‍රක්ස් පැකේජින් (පුද්ගලික) සමාගම
නො: 72, මහ විද්‍යාල මාවත
කොළඹ 13

පොලිතින්

සි/ස නිවි පීවා ඉන්ඩස්ට්‍රි (පුද්ගලික) සමාගම
පොල්වත්ත
කුන්ඩසාලේ
මහනුවර

සි/ස සෙල්මෝ (පුද්ගලික) සමාගම
59/1, නාරම්පොළ පාර,
මොරගල, දෙකටන

සි/ස ටෂ්ලයින් (පුද්ගලික) සමාගම

කොරිග්‍රේටඩ් පෙට්ට

සි/ස එක්ස්පැක් කොරිග්‍රේටඩ් කාටුන් (පුද්ගලික) සමාගම

සි/ස ශාජ ග්‍රැපික් හවුස් (පුද්ගලික) සමාගම

2014 වසරේ සිට 2018 වසර දක්වා ත්‍රිපෝෂ නිෂ්පාදනය (මාස්ටර් බෑග්)

මාසය	2014	2015	2016	2017	2018
ජනවාරි	40,316	47,901	57,542	56,236	51,069
පෙබරවාරි	47,708	43,679	53,416	48,288	40,351
මාර්තු	56,917	53,206	55,410	58,150	47,969
අප්‍රේල්	38,492	42,176	44,501	46,956	25,720
මැයි	56,456	57,367	52,757	49,432	55,122
ජූනි	51,654	53,393	15,757	40,134	50,268
ජූලි	57,309	61,000	-	48,128	49,042
අගෝස්තු	57,677	57,719	3,060	53,179	40,374
සැප්තැම්බර්	57,621	60,182	38,071	36,295	48,670
ඔක්තෝබර්	58,522	62,381	38,806	27,311	50,036
නොවැම්බර්	56,324	60,908	47,392	49,829	47,152
දෙසැම්බර්	42,072	48,633	28,898	30,017	23,703
මාස්ටර් බෑග්ස්	**621,068**	**648,545**	**435,610**	**543,955**	**529,476**
මෙට්‍රික් ටොන්	**13,974**	**14,592**	**9,801**	**12,239**	**11,913**

2014 සිට 2018 වසර දක්වා ත්‍රිපෝෂ නිෂ්පාදනය ප්‍රස්ථාරයක් මගින් (මාස්ටර් බැග්)



2017 අප්‍රේල් මස සිට 2018 වර්ෂය දක්වා සුපෝෂ නිෂ්පාදනය (මෙ.ටොන්)

මාසය/වර්ෂය	**2017**	**2018**
ජනවාරි	-	118
පෙබරවාරි	-	190
මාර්තු	-	296
අප්‍රේල්	49	174
මැයි	69	112
ජූනි	56	261
ජූලි	157	277
අගෝස්තු	152	229
සැප්තැම්බර්	157	265
ඔක්තෝබර්	135	300
නොවැම්බර්	252	224
දෙසැම්බර්	180	161
එකතුව	**1,207**	**2,607**

2017 අප්‍රේල් මස සිට 2018 වර්ෂය දක්වා සුපෝෂ නිෂ්පාදනය ප්‍රස්ථාරයක් මගින් (මෙ.ටොන්)



2019 අපේක්ෂිත ඉලක්කය

- නොමිලේ ලබා දෙනු ලබන ත්‍රිපෝෂ සියලුම ප්‍රතිලාභීන්ට ලබාදීමේ 100% ඉලක්කය ජයගැනීම.

- දේශීය ගොවියා තව තවත් සුරක්ෂිත කිරීමේ අරමුණ පෙරදැරිව ඔවුන්ගේ නිෂ්පාදන ගොවි සංවිධාන වෙතින් ත්‍රිපෝෂ ආයතනයට සපයා ගැනීම

- අප සතු සුපෝෂ අළෙවි නියෝජිත ජාලය තවදුරටත් පුළුල් කිරීම.

- නිෂ්පාදන කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යාමට අවශ්‍ය ප්‍රධාන අමුද්‍රව්‍ය කැඹනටි මණ්ඩල තිරන මගින් මිලදි ගැනීම මගින් අමුද්‍රව්‍ය හිඟයට විසඳුම් ලබාදීම

- නිෂ්පාදනය වැඩිවීමට සමාන්තරව ත්‍රිපෝෂ නිෂ්පාදනය ඉතා කාර්‍යක්ෂමව, නිවැරදිව සහ ඉතා පහසුවෙන් ඇසුරුම් කිරීමට හැකි වන පරිදි නව ඇසුරුම් යන්ත්‍ර දෙකක් මිලදි ගැනීමට කටයුතු කිරීම

- නිෂ්පාදන කටයුතු ඉතා කාර්යක්ෂමව සහ ඉහල ගුණාත්මක භාවයෙන් සිදු කිරීමට පහත සඳහන් දෑ මිලදි ගැනීමට කටයුතු කිරීම

  - ✓ වායුසම්කරන පද්ධතියක් කර්මාන්ත ශාලාව තුල ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කිරීම
  - ✓ සෙපරේටර් යන්ත්‍රයක්, ජනරේටරයක්, ඔටෝක්ලේව යන්ත්‍රයක්, බකට් එලිවේට යන්ත්‍රයක් මිලදි ගෙන සවි කිරීම
  - ✓ කර්මාන්ත ශාලාවේ පොලව ටයිල් කිරීමේ කටයුතු ආරම්භ කිරීම
  - ✓ නව කැබ් රථ දෙකක් මිලදි ගැනිම

2019 වර්ෂයේ ත්‍රිපෝෂ නිෂ්පාදනය පහත අයුරින් ඉහළ නැංවීම ආයතනයේ ඒකායන අපේක්ෂාවයි.

මාසය	2019	
	මාස්ටර් බැග්ස්	**පැකට්(ග්‍රෑම් 750)**
ජනවාරි	97,391	2,921,730
පෙබරවාරි	101,711	3,051,330
මාර්තු	110,351	3,310,530
අප්‍රේල්	92,531	2,775,930
මැයි	96,851	2,905,530
ජුනි	114,671	3,440,130
ජුලි	118,991	3,569,730
අගෝස්තු	113,591	3,407,730
සැප්තැම්බර්	113,591	3,407,730
ඔක්තෝබර්	113,591	3,407,730
නොවැම්බර්	105,491	3,164,730
දෙසැම්බර්	101,711	3,051,330
එකතුව	**1,280,472**	**38,414,160**

ත්‍රිපෝෂ බෙදා හැරීමේ ක්‍රියාවලිය

ත්‍රිපෝෂ කර්මාන්ත ශාලාව (ජා-ඇල)



බෙදාහැරීමේ කටයුතු කිරීම (ලොරි රථ මගින් හා දුම්රිය වැගන් මගින්)







ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි

සෞඛ්‍ය මධ්‍යස්ථාන (සායන)

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය

වතු

ළමා මධ්‍යස්ථාන







ත්‍රිපෝෂ ප්‍රතිලාභීන්

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම මගින් ත්‍රිපෝෂ නිෂ්පාදනය සිදු කර සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා ක්‍රමානුකූලව බෙදාහැරීම් කටයුතු සිදු කරනු ලැබේ.

ත්‍රිපෝෂ බෙදාහැරීමේ මධ්‍යස්ථාන

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ

1. මධ්‍යම පළාත
2. නැගෙනහිර පළාත
3. උතුරු මැද පළාත
4. වයඹ පළාත
5. උතුරු පළාත
6. සබරගමුව පළාත
7. දකුණු පළාත
8. ඌව පළාත
9. බස්නාහිර පළාත

වතු අධිකාරී

1. හැටන්
2. මාතලේ
3. කෑගල්ල
4. මහනුවර
5. කළුතර
6. නුවර එළිය
7. මාතර
8. බදුල්ල
9. ගාල්ල
10. රත්නපුර

වෙනත්

1. හමුදා රෝහල්
2. පොලිස් රෝහල්
3. ලදරු පාසල්
4. නගර සභා
   - මීගමුව
   - කොළඹ
   - මාතලේ
   - ගාල්ල
   - නුවර

පරිවාස හා ළමා ආරක්ෂණ අධිකාරී

1. අනුරාධපුරය
2. බත්තරමුල්ල
3. බදුල්ල
4. ගාල්ල
5. යාපනය
6. ත්‍රිකුණාමලය
7. කුරුණෑගල
8. රත්නපුර
9. කෑගල්ල
10. නුවර

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ

1. අම්පාර
2. අනුරාධපුරය
3. බදුල්ල
4. මඩකලපුව
5. කොළඹ
6. ගාල්ල
7. ගම්පහ
8. හම්බන්තොට
9. යාපනය
10. කල්මුණේ
11. කළුතර
12. රත්නපුර
13. ත්‍රිකුණාමලය
14. මහනුවර
15. කෑගල්ල
16. කිලිනොච්චිය
17. කුරුණෑගල
18. මාතලේ
19. මාතර
20. මන්නාරම
21. මොණරාගල
22. නුවර එළිය
23. පොළොන්නරුව
24. පුත්තලම
25. වව්නියාව

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ ගණන

1. අම්පාර	07	10. කල්මුණේ	13	19. මාතර	16
2. අනුරාධපුරය	18	11. කළුතර	13	20. මන්නාරම	03
3. බදුල්ල	15	12. රත්නපුර	17	21. මොණරාගල	11
4. මඩකලපුව	13	13. ත්‍රිකුණාමලය	10	22. නුවර එළිය	11
5. කොළඹ	11	14. මහනුවර	21	23. පොළොන්නරුව	07
6. ගාල්ල	19	15. කෑගල්ල	11	24. පුත්තලම	11
7. ගම්පහ	16	16. කිලිනොච්චිය	04	25. වව්නියාව	04
8. හම්බන්තොට	12	17. කුරුණෑගල	23		
9. යාපනය	11	18. මාතලේ	12		

2018 වර්ෂයේ ත්‍රිපෝෂ බෙදා හැරීමේ තොරතුරු

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	2018 වර්ෂයේ බෙදාහරින ලද ත්‍රිපෝෂ බැග්		
		මව්වරුන්ට	ළමයින්ට	එකතුව
අම්පාර	29,955	3,133	10,033	13,166
අනුරාධපුරය	60,607	6,874	12,270	19,144
බදුල්ල	45,380	3,623	13,300	16,923
මඩකලපුව	53,175	3,638	16,729	20,367
කොළඹ රෝහල	5,465	567	2,964	3,531
කොළඹ නගර සභාව	12,114	1,760	7,265	9,025
කොළඹ (දකුණ)	50,305	9,725	24,528	34,253
ගාල්ල	49,140	6,502	12,767	19,269
ගම්පහ	59,426	18,277	26,958	45,235
හම්බන්තොට	39,953	5,295	16,755	22,050
යාපනය	22,577	2,128	7,091	9,219
කල්මුණේ	49,613	3,831	14,712	18,543
කළුතර	36,784	8,469	16,215	24,684
මහනුවර	70,054	6,582	12,799	19,381
කෑගල්ල	29,986	5,994	14,342	20,336
කිලිනොච්චිය	10,044	1,342	2,678	4,020
කුරුණෑගල	74,841	7,679	17,108	24,787
මන්නාරම	7,170	1,884	4,549	6,433
මාතලේ	28,796	3,614	7,749	11,363
මාතර	52,983	7,264	14,335	21,599
මොණරාගල	28,148	3,461	7,989	11,450
නුවරඑළිය	32,155	5,320	15,532	20,852
පොළොන්නරුව	28,557	2,870	8,321	11,191
පුත්තලම	29,868	6,160	16,741	22,901
රත්නපුර	46,510	7,022	18,192	25,214
ත්‍රිකුණාමලය	25,385	3,173	7,787	10,960
වව්නියාව	10,228	1,222	2,509	3,731
මුලතිව්	5,038	672	1,344	2,016
එකතුව	**994,257**	**138,368**	**336,383**	**474,751**

පරිවාස ළමා රක්ෂණ මධ්‍යස්ථාන	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	2018 වර්ෂයේ බෙදාහරින ලද ත්‍රිපෝෂ බැග්
09	23,396	18,684

වතු ප්‍රදේශ	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	2018 වර්ෂයේ බෙදාහරින ලද ත්‍රිපෝෂ බෑග්		
		මව්වරුන්ට	ළමයින්ට	එකතුව
හැටන්	10,335	1,487	5,480	6,967
මාතලේ	2,843	412	1,866	2,278
කෑගල්ල	4,287	995	2,464	3,459
මහනුවර	5,324	915	3,299	4,214
කළුතර	2,469	401	1,551	1,952
නුවරඑළිය	11,510	2,344	6,694	9,038
මාතර	1,042	138	722	860
බදුල්ල	10,685	2,020	5,720	7,740
ගාල්ල	1,070	164	677	841
රත්නපුර	4,728	923	2,823	3,746
එකතුව	**54,293**	9,799	31,296	41,095

2018 වර්ෂයේ ත්‍රිපෝෂ බෙදාහැරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව

	මධ්‍යස්ථාන සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාස 26 වෙනුවෙන්	705	994,257
වතු	416	54,293
පරිවාස හා ළමාරක්ෂණ දෙපාර්තමේන්තුවේ ළමා නිවාස	10	23,396
එකතුව	**1,131**	**1,071,946**

අලෙවි අංශය

01. අලෙවි අංශයේ ආරම්භය

“රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූල වන වෙනත් අනුමත පෝෂ්‍ය පදාර්ථයන් නිපදවීම සහ අලෙවිකරණය“ ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම පිහිටු වීමේ තවත් එක් පරමාර්ථයකි. මෙම පරමාර්ථය යථාර්තයක් කරමින් 2016 වර්ෂයේ දී නව යන්ත්‍ර සූත්‍ර ස්ථාපිත කිරීම නිසා නිපදවන ලද අතිරික්ත ත්‍රිපෝෂ නිෂ්පාදනය “සුපෝෂ“ නමින් වෙළඳපොලට හඳුන්වාදීමට 2017 වර්ෂයේදී කටයුතු කරන ලදී.

02. අලෙවි අංශය ආරම්භ කිරීමේ අරමුන

රාජ්‍ය ආයතන යනු අලාභ ලබන ආයතනය යන මිත්‍යා මතයට අභියෝග කරමින් රජයට බරක් නොවන රජය මත යැපෙන ආයතනයක් නොවි ස්වාධිනව උපයාගත් ආදායම මත යැපෙන ලාභ ලබන රාජ්‍ය ආයතනයක් වීම.

03. අලෙවි අංශයේ විකාශනය

මෙම සුපෝෂ නිෂ්පාදනය ග්‍රෑම් 100, ග්‍රෑම් 250, ග්‍රෑම් 500 සහ ග්‍රෑම් 750 යන බාණ්ඩ 04 යටතේ අලෙවි නියෝජිතයින් 06 දෙනෙකු මගින් මහනුවර, කළුතර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මුලින්ම වෙළඳපොළට හඳුන්වාදෙන ලදී.

2018 වර්ෂය අවසන් වන විට 39 දෙනෙකුගෙන් සමන් විත අලෙවි නියෝජිත ජාලයක් මගින් දිවයිනේ දිස්ත්‍රික්ක 11ක් ආවරණය කිරීමට හැකි වී ඇත. මීට අමතරව ත්‍රිපෝෂ සමාගම් පරිශ්‍රය තුල සුපෝෂ සහ හයිලන්ඩ් නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි කුටියක්ද විවෘත කරන ලදී.

2018 වර්ෂයේ සුපෝෂ ඇතුළු අනෙකුත් නිෂ්පාදන අලෙවියෙන් උපයාගන්නා ලද ආදායම රු මිලියන 574ක් වන අතර ශුද්ධ ලාභය රු මිලියන 120කි.

2018 වර්ෂයේ සුපෝෂ අලෙවි ආදායම (රු 000)



2018 වර්ෂය තුළ අත්කරගත් ජයග්‍රහණ, ඒ සඳහා දියත් කරන ලද ක්‍රියාමාර්ග සහ මුහුන දිමට සිදුවූ අභියෝග

2018 වසරේ අප ලද ජයග්‍රහන

01. සුපෝෂ අලෙවි නියෝජිත ජාලය 42 දක්වා වැඩි කරගැනීම. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2018 වර්ෂයේ අලෙවි ආදායම රු මිලියන 523ක් දක්වා වැඩි කරගැනීම මගින් රු මිලියන 120ක ලාභයක් ඉපයීම.

02. සුපෝෂ පිට භාවිතයෙන් නව කේක් වර්ගයක් හදුන්වාදිම

ඉලක්ක සපුරා ගැනීම සඳහා 2018 වර්ෂයේදි දියත් කරන ලද ක්‍රියාමාර්ග

01 නිෂ්පාදන කටයුතු අබාණ්ඩව සිදු කරගෙන යාමට අවශ්‍ය ප්‍රධාන අමුද්‍රව්‍ය කැබිනට් මණ්ඩල තීරන මගින් මිලදි ගැනිමට කටයුතු කිරීම

02 මෙ.ටොන් 200 සයිලෝව සඳහා U Type Conveyor පද්ධතියක් සවි කිරීම සහ ඊට Pipe Screw Type Conveyor පද්ධතියක් සවි කිරීම

03 High Efficiency Separator Filter එකක් සවි කිරීම

04 ඇසුරුම් අංශයේ ඇති ඇසුරුම් යන්ත්‍ර තුනක් සඳහා Thermal Transfer Code සවි කිරීම

05 ඇසුරුම් අංශය සඳහා සුදු යකඩයෙන් සකසන ලද ත්‍රිපෝෂ ගබඩා කිරීමට ටැංකියක් සවි කිරීම

06 සුපෝෂ අලෙවි සැල පුළුල් කිරීම

2018 වසරේ මුහුන දිමට සිදුවූ අභියෝග

01 ඉතා දිගු කාලයක් කේෂ්ත්‍රයේ රැඳි සිටීමින් සන්නාමයන් සහිතව වෙළඳ පොළ තුල ඒකාධිකාරයක් ස්ථාපිත කරගෙන ඇති ආයතන සමග තරගකාරිත්වයට මුහුන දිමට සිදු වීම. නමුත් ඉහල තරගකාරිත්වය හමුවේ ත්‍රිපෝෂ සන්නාමය සමග සුපෝෂ ප්‍රචාරන කටයුතු සිදු කිරීම නිසා වෙළඳ පොළ සහ පාරිභෝගිකයා රදවා තබාගැනිමට හැකිවේ.

02 මෙම කර්මාන්තයේ ඇති මහා පරිමාන ආයතන විවිධ ප්‍රචාරන මාධ්‍යයන් යොදා ගනිමින් තම නිෂ්පාදනයන් සඳහා ඉහල ප්‍රචාරනයක් ලබාදිම

03 සීමාකාරී සාධක හේතුවෙන් ඉල්ලුමට සරිලන සැපයුමක් ලබාදිමට නොහැකි වීම

2019 වර්ෂයේ සාර්ථකත්වය වෙනුවෙන් යෝජනා සහ අපේක්ෂිත ඉලක්ක

2019 වර්ෂයේ සාර්ථකත්වය වෙනුවෙන් යෝජනා

01. පාරිභෝගික අවශ්‍යතාවය 100% සම්පූර්ණ කිරීමට නිෂ්පාදනය සඳහා අවශ්‍යය අමුද්‍රව්‍ය අඛන්ඩව මිලදි ගැනිම.

02. අමුද්‍රව්‍ය හිඟ කාලවලදිද නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය අමුද්‍රව්‍ය ගබඩා කර තබාගැනිම අවශ්‍ය ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම. මේ සඳහා මෙ.ටොන් 4000 ප්‍රමානයේ සයිලෝ එකක් ඉදිකිරීම.

03. ත්‍රිපෝෂ සමාගම සඳහා වාර්ෂික අයවැයෙන් වෙන්කරනු ලබන ප්‍රතිපාදන වැඩි කිරීම.

04. අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් මගින් සුපෝෂ නව නිෂ්පාදනය පාරිභෝගිකයින් අතර වඩාත් ප්‍රචලිත කිරීම හා වෙළඳ පොළට හඳුන්වාදීම.

05. අළෙවි නියෝජිත ජාලය මුළු දිවයිනම ආවරණය වන පරිදි වඩාත් පුළුල් කිරීම.

06. අවසන් නිෂ්පාදනය නියමිත ප්‍රතිලාභියා ලබාදීම සඳහා බෙදාහැරීමේ කටයුතු විදිමත් හා කාර්‍යක්ෂම කිරීම

අපේක්ෂිත ඉලක්ක - 2019

01. අලෙවි ආදායම රු මිලියන 750 දක්වා වැඩිකර ගැනීම සහ මෙය වාර්ෂිකව 20% කින් ඉහල නැංවීම. 2019 වර්ෂයේ ජූලි මාසය වන විටත් අලෙවි ආදායම රු මිලියන 368 සීමාව ඉක්මවා යාමට හැකි වී ඇත.

02. දිවයිනේ දිස්ත්‍රික්ක 24 ආවරණය වන පරිදි අලෙවි නියෝජිත ජාලය පුළුල් කිරීම

අවසන් ඉලක්කය

රජයට බරක් නොවන රජය මත යැපෙන ආයතනයක් නොවි ස්වාධීනව උපයාගත් ආදායම මත යැපෙන රාජ්‍ය ආයතනයක් විම අපගේ අවසන් ඉලක්කය වේ.

ස්තූතිය

අප දිරිමත් කරමින් නිරතුරු අපට මාර්ගෝපදේශකත්වය ලබා දුන් සෞඛ්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමාට, අපට නිරතුරු අවශ්‍ය සහය ලබා දුන් නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍ය ගරු ෆයිසල් කසිම් මැතිතුමාට, අප නිසි මගට යොමු කරමින් උපදෙස් ලබා දුන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ගරු ජනක සුගතදාස මැතිතුමාට සහ අපට වාර්ෂිකව අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් අතහිත දුන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරයේ ලේකම් ගරු ආර්. එච්. එස්. සමරතුංග මැතිතුමාට අපගේ ස්තූතිය පුදකර සිටිමු.

එලෙසින්ම ආයතනයේ කළමනාකාරීත්වය දරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම මහත්ම, මහත්මීන්ගෙන් ලද සහාය අප සැමට ආශීර්වාදයක්ම විය. එමෙන්ම අපගේ සැපයුම්කරුවන් හා බාහිරව අපට සේවය සලසන සැම කෘතඥ පූර්වකව සිහිපත් කරමු.

අපගේ ආයතනයේ ඉහළ සිට පහළටත්, පහළ සිට ඉහළටත් ගලා යන ධුරාවලින් තෘප්තිමත්ව සේවය කරන කාර්ය මණ්ඩලයක් දක්නට ලැබීම ඉමහත් සතුටකි. ආයතනයේ දියුණුවට ඔවුන් ලබා දෙන දායකත්වය අගය කළ යුතුය. අවසන් වශයෙන් මෙම ඉලක්ක ජය ගැනීමට නිරතුරු වෙහෙසෙන ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ සමස්ත කාර්ය මණ්ඩලයට ජයග්‍රහණයේ ප්‍රණාමය පුදකර සිටිමු.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
විස්තිරණ ආදායම් හා වියදම් ප්‍රකාශය
2018 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2018/12/31 රු.	ශත.	2017/12/31 රු.
ආදායම				
ආදායම	02	2,806,718,129.68		2,183,706,297
අඩු කළා :පරිභෝජනයට සුදානම් නිෂ්පාදනවල පිරිවැය	03	(2,230,761,256.16)		(1,904,609,041)
: විකුණුම් පිරිවැය	04	(424,567,749.72)		(168,059,812)
		151,389,123.80		**111,037,444**
වෙනත් ආදායම්	05	37,813,850.10		28,982,331
අඩු කළා : පිරිවැය				
විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය	06	19,710,985.68		21,413,625
පරිපාලන වියදම්	07	79,340,635.12		54,560,274
මූල්‍ය සහ වෙනත් වියදම්	08	11,510,380.04		195,624
		110,562,000.84		**76,169,523**
වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම		**78,640,973.06**		**63,850,252**

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉතා වැදගත් කොටසක් වන පිටු අංක 7 සිට 23 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශ සඳහා සිදු කරන ලද සටහන් හා එක්ව ඉහත සඳහන් විස්තිර්ණ ආදායම් ප්‍රකාශය කියවනු ලැබිය යුතුය.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
2018 දෙසැම්බර් මස 31 වන දිනට

	සටහන්	2018/12/31 රු. ශත.	2017/12/31 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ	12	655,757,869.75	669,513,546
අස්පෘශ්‍ය වත්කම්	13	165,296.90	330,594
		655,923,166.65	**669,844,139**
කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ	14	22,513,629.40	-
ජංගම වත්කම්			
වට්ටෝරු භාණ්ඩ	15	127,134,727.41	200,083,241
වෙළඳ සහ වෙනත් ලැබීම් නියමිත	16	212,780,368.24	149,350,593
මුදල් හා මුදල් සමාන දෑ	17	335,266,293.23	200,216,301
		675,181,388.88	**549,650,135**
මුළු වත්කම්		**1,353,618,184.93**	**1,219,494,274**
කොටස් හිමිකම් හා බැරකම්			
ප්‍රාග්ධනය හා සංචිත			
කල් තබන ලද බැරකම්	19	390,085,607.56	395,491,067
ප්‍රත්‍යාගණන සංචිත	20	306,378,657.65	306,378,658
වියදම ඉක්මවූ සමුච්චිත ආදායම		422,306,485.10	343,665,512
මුළු කොටස් හිමිකම්		**1,118,770,750.31**	**1,045,535,237**
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	21	44,898,532.10	42,956,779
වෛද්‍යාධාර අරමුදල	22	209,446.78	176,422
		45,107,978.88	**43,133,201**
ජංගම බැරකම්			
වෙළඳ සහ වෙනත් ගෙවීම් නියමිත	23	189,739,455.74	130,825,836
මුළු කොටස් හිමිකම් හා බැරකම්		**1,353,618,184.93**	**1,219,494,274**

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉතා වැදගත් කොටසක් වන පිටු අංක 7 සිට 23 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා සිදු කරන ලද සටහන් හා එක්ව ඉහත සඳහන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය කියවනු ලැබිය යුතුය.

මෙම මූල්‍ය ප්‍රකාශ, 2007 අංක 07 දරන සමාගම් පනතේ දක්වා ඇති නියමයන්ට අනුකූලව සකස් කරනු ලැබ ඇත.

.....
මූල්‍ය ප්‍රධානි

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිම දැරිය යුතු වන්නේ ය.

මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අනුමත කර, අත්සන් තබන ලදී.

....
සභාපති **අධ්‍යක්ෂ**

ජා ඇල, කපුවත්ත
දිනය : 14/03/2019

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
කොටස් නිමිකම් වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය
2018 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා

		ප්‍රාග්ධන සංචිත		ප්‍රත්‍යාගණන සංචිත		වියදම් ඉක්මවූ සමුච්චිත ආදායම		එකතුව	
	සටහන	රු.	ශත.	රු.	ශත.	රු.	ශත.	රු.	ශත.
2017.01.01 වන දිනට ශේෂය		380,421,185.26		307,170,027.56		307,683,544.60		995,274,757.42	
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන		70,386,741.08		-		-		70,386,741.08	
ක්ෂය වීම් - සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන වත්කම්		(55,316,859.32)		-		-		(55,316,859.32)	
ව්‍යපහරණ වත්කම් මත ප්‍රත්‍යාගණන ලාභ /අලාභ				(791,369.91)		-		(791,369.91)	
පූර්ව වර්ෂයේ ගැළපුම් - 2017		-		-		(27,868,284.10)		(27,868,284.10)	
2017 වර්ෂයේ වියදම් ඉක්මවූ ආදායම		-		-		63,850,251.54		63,850,251.54	
2017.12.31 වන දිනට ශේෂය		**395,491,067.02**		**306,378,657.65**		**343,665,512.04**		**1,045,535,236.71**	
2018.01.01 වන දිනට ශේෂය		395,491,067.02		306,378,657.65		343,665,512.04		1,045,535,236.71	
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	19	50,974,042.59		-		-		50,974,042.59	
ක්ෂය වීම් - සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන වත්කම්	19	(56,379,502.03)		-		-		(56,379,502.03)	
2018 වර්ෂයේ වියදම් ඉක්මවූ ආදායම		-		-		78,640,973.06		78,640,973.06	
2018.12.31 වන දිනට ශේෂය		**390,085,607.58**		**306,378,657.65**		**422,306,485.10**		**1,118,770,750.33**	

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2018 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා

	2018/12/31 රු.	2017/12/31 රු.
මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහ		
වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම	**78,640,973**	**63,850,252**
ගැළපුම්		
ක්ෂය වීම්	57,664,125	56,009,370
ව්‍යපහරණ අලාභ	10,639,533	-
වර්ෂය සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන	5,663,671	9,185,605
වෛද්‍යාධාර දායකත්වය සඳහා ප්‍රතිපාදන	231,068	98,600
පූර්ව වර්ෂ ගැළපුම්	-	(27,868,284)
	74,198,397	**37,425,291**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	**152,839,370**	**101,275,542**
කාරක ප්‍රාග්ධනයේ සිදුවූ වෙනස්කම්		
වෙළඳ හා සහ වෙනත් ලැබීම් නියමිත වල වැඩිවීම / (අඩුවීම)	(63,429,775)	(77,830,092)
වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත වල වැඩිවීම / (අඩුවීම)	58,913,620	113,927,062
වට්ටෝරු භාණ්ඩ වැඩිවීම / (අඩුවීම)	72,948,513	6,024,838
	68,432,358	**42,121,807**
පාරිතොෂික ගෙවීමට පෙර මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	221,271,728	143,397,349
අඩු කළා : ගෙවන ලද පාරිතෝෂිත	(3,721,918)	(4,087,601)
වෛද්‍ය ප්‍රතිලාභ ගෙවීම්	(198,044)	(160,857)
මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**217,351,767**	**139,148,892**
ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහ		
දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ අත්කර ගැනීම	(55,024,828)	(60,150,025)
කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ	(22,513,629)	-
පොලි ආදායම	642,143	848,633
ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ	**(76,896,315)**	**(59,301,392)**
මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහ		
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	(5,405,459)	15,069,882
මුදල් හා මුදල් සමාන දෑ වෙනස්වීම්	135,049,992	94,917,382
මුදල් හා මුදල් සමාන දෑ ඉඳිරියට ගෙන එන ලදී	200,216,301	105,298,919
මුදල් හා මුදල් සමාන දෑ ඉඳිරියට ගෙන යන ලදී	**335,266,293**	**200,216,301**
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති මුදල් සහ මුදල් සමාන දෑ හි විශ්ලේෂණය		
අතැති මුදල්	20,000	20,000
ලංකා බැංකුව, ජා-ඇල 71324617	29,691,455	13,530,026
ලංකා බැංකුව, ජා-ඇල ගිණුම් අංක 80306903	153,631,019	45,902,793
භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජන	92,580,625	92,988,272
ස්ථාවර තැන්පත් මත ආයෝජන	59,343,195	47,775,210
	335,266,293	**200,216,301**

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

නිෂ්පාදන ගිණුම

2018 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	2018/12/31 රු. ශත.	2017/12/31 රු.
නිෂ්පාදන පිරිවැය			
අමු ද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය			
2018.01.01 වන දිනට ශේෂය		146,784,459.46	151,509,363
මිලදී ගැනිම්	09	1,813,404,372.61	1,564,586,324
		1,960,188,832.07	1,716,095,686
2018.12.31 වන දිනට ශේෂය	15	(88,411,099.24)	(146,784,459)
පරිභෝජනය කළ අමුද්‍රව්‍යවල පිරිවැය		**1,871,777,732.83**	**1,569,244,940**
සෘජු ශ්‍රම පිරිවැය හා කළමනාකරණ පිරිවැය	10	187,261,754.66	178,601,881
කම්හල් පොදුකාර්ය වියදම්	11	162,148,537.19	141,801,206
ප්‍රති සැකසුම් අලාභය		(112,656.25)	(2,356)
මූලික පිරිවැය		**2,221,075,368.43**	**1,889,645,672**
කෙරෙමින් පවත්නා වැඩ			
2018.01.01 වන දිනට ශේෂය		2,388,929.16	8,215,484
2018.12.31 වන දිනට ශේෂය	15	(12,605,572.55)	(2,388,929)
		(10,216,643.39)	**5,826,555**
මුලු නිෂ්පාදන පිරිවැය		**2,210,858,725.04**	**1,895,472,227**

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
"සුපෝෂ"
විස්තිරණ ආදායම් හා වියදම් ප්‍රකාශය
2018 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	2018/12/31 රු. ශත.	2017/12/31 රු.
ආදායම			
ආදායම	**02**	574,093,313.58	255,227,932
අඩු කළා : විකුණුම් පිරිවැය	**04**	(424,567,749.72)	(168,059,812)
		149,525,563.86	**87,168,119**
වෙනත් ආදායම්	**05**	5,931,799.46	1,411,833
වියදම්			
විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය	**06**	10,262,087.21	5,706,166
පරිපාලන වියදම්	**07**	23,647,099.18	2,508,562
මූල්‍ය සහ වෙනත් වියදම්	**08**	1,004,580.00	274,328
		34,913,766.39	**8,489,057**
2018 වර්ෂය සඳහා වියදම ඉක්මවූ ආදායම		**120,543,596.93**	**80,090,895**

1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1.1 වාර්තා කිරීමේ ආයතනය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්, පූර්ණ රජය සතු සමාගමක් ලෙස ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කර පිහිටුවා ඇති, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන සීමිත වගකීමක් සහිත සමාගමකි. සමාගමේ ලියා පදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව, ජා ඇල, කපුවත්ත, තැ.පෙ. අංක 17 යන ලිපිනයෙහි පිහිටා ඇත.

1.1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ "ත්‍රිපෝෂ බෙදාහැරීමේ වැඩසටහන" සඳහා "ත්‍රිපෝෂ" නිෂ්පාදනය කරනු ලබන එකම සමාගම වනුයේ මෙම සමාගමයි.

සමාගමේ වෙනත් ප්‍රධාන කාර්යයන් වූයේ :

- ශ්‍රී ලංකාව තුළ මාතෘ සහ ළමා මන්දපෝෂණය අඩු කිරීම සඳහා ශක්ති වර්ධක ශ්‍රී ලාංකික අතිරේක ආහාර නිෂ්පාදිතයක් වන "ත්‍රිපෝෂ" වැඩි දියුණු කිරීම, නිෂ්පාදනය සහ බෙදා හැරීම පිණිස පහසුකම් සැලසීම.
- ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අමු ද්‍රව්‍ය සපයනු ලබන දේශීය ගොවීන් හැකි තාක් දුරට ආදායම් ජනනය වන මාර්ග සඳහා ධෛර්යමත් කිරීම.
- රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව, වෙනත් ආකාරයේ ශක්තිවර්ධක මිශ්‍ර කරන ලද ආහාර ද්‍රව්‍ය සඳහා පවතින වෙළඳපොළ අවම කිරීම.
- වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාව පිළිබඳව ඇගයීමක් සිදු කර, එය සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

1.1.3 අධ්‍යක්ෂ මණ්ඩලය

1. එම්. ඩී. බන්දුසේන මහතා (සභාපති)
2. වෛද්‍ය අනිල් ජාසිංහ මහතා
3. වෛද්‍ය ශාන්ති ගුණවර්ධන මහත්මිය
4. එච්. එම්. තේජා හේරත් මහත්මිය
5. චමන්දිකා හේරත් මහත්මිය
6. වෛද්‍ය දමයන්ති හපුගොඩ මහත්මිය
7. දර්ශන විජේසිරිවර්ධන මහතා
8. ටී. ආර්. සී. චිත්‍රලතා මහත්මිය (නිරීක්ෂක)

මණ්ඩලයේ ලේකම්
තනූජා ප්‍රියදර්ශනී අල්විස් මහත්මිය

1.1.4 විගණක

ජාතික විගණන කාර්යාලය
අංක 306 / 72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

1.1.5 බැංකුකරුවන්

ලංකා බැංකුව,
ජා ඇල.

1.1.6 නිකුත් කිරීම සඳහා බලය ලත් දිනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවට අනුව, 2018 දෙසැම්බර් මස 31 වන දිනට අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම පිණිස අවසර ලබා දෙන ලදී.

1.1.7 සකස් කිරීමේ පදනම

අ. අනුකූලතාව දැක්වීමේ ප්‍රකාශය

ගිණුම්කරණ ප්‍රතිපත්තීන්, පදනම් සහ සටහන් (''මූල්‍ය ප්‍රකාශ'') සමඟ විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, සම කොටස්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී වරුන්ගේ සංගමය විසින් නිකුත් කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලවය.

ආ. නිර්ණය කිරීමේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණය කිරීම් සිදු කරනු ලබන අවස්ථාවන්හි දී හැර, මෙම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරනු ලැබ ඇත.

ඇ. සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන කාල සීමාව තුළ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීමේ සහ අන්තර් කාල සීමා තුලනාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින්, එම මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පෙර වර්ෂයේ සියලුම වටිනාකම් සම්බන්ධයෙන් ගුණාත්මක, විස්තරාත්මක සහ ව්‍යක්ත තොරතුරු ඇතුලත් සංසන්දනාත්මක තොරතුරු අනාවරණය කරනු ලැබේ.

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, වෙනත් යම් අයුරකින් දක්වා ඇති අවස්ථාවක දී හැරුණු කොට, මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලුම කාල සීමාවන් සඳහා අඛණ්ඩව අදාළ කරගනු ලැබ ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගත විෂයයන්හි ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය කිරීම සංශෝධනය කරනු ලැබ ඇති අවස්ථාවක දී, මනා ඉදිරිපත් කිරීමක් සිදු කිරීම පිණිස වත්මන් වර්ෂය හා අනුකූල වීම සඳහා සංසන්දනාත්මක වටිනාකම් ද නැවත වර්ගීකරණයට ලක් කරනු ලැබ ඇත.

ඈ. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ වලංගු මුදල

සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ වලංගු මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබේ.

ඉ. ප්‍රධාන ඇස්තමේන්තු සහ වැදගත් තීන්දු භාවිත කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගත වූ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම මඟින් කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හි ගිණුම්කරණ ප්‍රතිපත්ති වල භාවිතය හා වාර්තාගත වටිනාකම් කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන ස්වරූපයේ තීන්දු ගැනීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ පූර්ව නිගමන වලට එළඹීම අපේක්ෂා කෙරේ. තථ්‍ය ප්‍රතිඵල, මෙම ඇස්තමේන්තු වලින් සහ යොදා ගන්නා ලද නිගමන වලින් වෙනස් විය හැකි ය.

ඇස්තමේන්තු සහ පාදක කර ගත් පූර්ව නිගමන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුව සංශෝධනය කරනු ලබන කාල සීමාව තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සිදු කරනු ලබන සංශෝධන හඳුනා ගනු ලබන්නේ, එම සංශෝධනය එම කාල සීමාව සඳහා පමණක් බලපාන්නේ නම් හෝ එකී සංශෝධනය වර්තමාන සහ අනාගත කාල සීමා දෙකටම බලපාන්නේ නම්, එම සංශෝධන කාල සීමාව සහ අනාගත කාල සීමාවන් තුළදී ය.

ජ. අඛණ්ඩ පැවැත්ම

නුදුරු අනාගත කාලය තුළ ක්‍රියාත්මක ව්‍යාපාරයක් වශයෙන් සමාගම නොකඩවා පවත්වාගෙන යාමට ඊට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් කර ඇති අතර ස්වකීය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යාමට අවශ්‍ය තරමේ ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව පවතින බවට මණ්ඩලය සැහීමට පත් වෙමින්, ඒ අනුව, සමාගම ක්‍රියාත්මක තත්වයේ පවත්වාගෙන යාමේ උපකල්පනය නුදුරු අනාගත කාල සීමාව තුළ නොකඩවා යොදාගත හැකි බවට ද සහතික වෙයි.

1.2 වත්කම් සහ එම වත්කම් තක්සේරු කිරීමේ පදනම්

1.2.1 දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ

අ. හඳුනා ගැනීම සහ ඇගයීම

දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ විෂයයන් පිරිවැය යටතේ හෝ සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද සාධාරණ අගය යටතේ සහ වෙනත් යම් දුබලතා අලාභ යටතේ දක්වා ඇත.

සියලුම දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ විෂයයන් මූලික වශයෙන් පිරිවැය යටතේ හෝ සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද පිරිවැය යටතේ සහ යම් දුබලතා අලාභ යටතේ වාර්තා කර ඇත. වත්කමක වැදගත් අංග හඳුනා ගෙන, වෙන වෙනම ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ. දේපල, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණවල වැදගත් අංග අන්තර් කාලය තුළ ආදේශ කරනු ලැබීමට අවශ්‍ය වන්නේ නම්, ආයතනය විසින් එම ආදේශ කළ කොටස බැහැර කරන අතර, නව කොටසෙහිම ප්‍රයෝජ්‍ය ජීව කාලය සහ ක්ෂය වීම් සමඟ එම කොටස හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියලුම අලුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය පැන නඟිනු ලබන පරිදි, ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

ආ. පිරිවැය

දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණවල පිරිවැය, ඒවා මිලදී ගත් මිල සහ එයින් අපේක්ෂිත කාර්යය උදෙසා එම වත්කම ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම පිණිස සෘජුවම දරන ලද වෙනත් පිරිවැයෙන් සමන්විත වේ.

ඉපැයීමේ ධාරිතාව පවත්වාගෙන යාමේ හෝ ඉහළ නැංවීමේ අරමුණින්, ස්ථිර ස්වරූපයේ වත්කම් අත්පත් කර ගැනීම, ඳිර්ෂ කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරනු ලබන පසු කාලීන වියදම්, ප්‍රාග්ධන වියදම් සේ සලකනු ලැබ ඇත.

ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ පරීක්ෂා කිරීමේ වියදම් ඇතුලත්, වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කරනු ලබන දේපළක, පිරියතක සහ යන්ත්‍රෝපකරණයක එක් අංගයක් ආදේශ කිරීම සඳහා දරනු ලබන වියදම, ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. වෙනත් පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ, එම අංගයේ ඇතුලත් ඉදිරි ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමේ හැකියාවක් පවති නම් සහ එහි පිරිවැය යථාර්ථවාදී ලෙස ගණනය කළ හැකි නම් පමණි.

ඇ. ප්‍රත්‍යාගණනය කිරීම

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂයේ දී ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය සතු සියලුම දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනය කරන ලදි.

ඈ. ක්ෂය කිරීම්

වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය මත එම වත්කම්හි පිරිවැය ඉවත් කිරීම පිණිස, පහත සඳහන් වටිනාකම් යටතේ සෘජු රේඛීය පදනම (straight-line basis) මත වාර්ෂිකව, ප්‍රාග්ධන සංචිතය වෙත ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ.

ගොඩනැගිලි	අවුරුදු 20 ට වැඩි
පිරියත සහ යන්ත්‍රෝපකරණ	අවුරුදු 10 ට වැඩි
මෝටර් රථ	අවුරුදු 05 ට වැඩි
යන්ත්‍රෝපකරණ හා උපකරණ	අවුරුදු 05 ට වැඩි
විද්‍යාගාර උපකරණ	අවුරුදු 10 ට වැඩි
කෘෂිකාර්මික උපකරණ	අවුරුදු 10 ට වැඩි

විදුලි වැඩ	අවුරුදු 05 ට වැඩි
කාර්යාල උපකරණ	අවුරුදු 10 ට වැඩි
ලී බඩු සහ සවි කිරීම්	අවුරුදු 10 ට වැඩි
පරිගණක උපකරණ	අවුරුදු 04 ට වැඩි
අස්පෘශ්‍ය වත්කම්	අවුරුදු 04 ට වැඩි

ඉ. හඳුනා නොගැනීම

බැහැර කරන විටදී හෝ භාවිතයෙන් කිසිදු ඉදිරි ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරනු ලබන අවස්ථාවක දී, දේපළක, පිරියතක සහ යන්ත්‍රෝපකරණයක අංගයක් හඳුනා නොගනු ලැබූ සේ සැලකේ. වත්කම් හඳුනා නොගැනීම මත හිමි වන ඕනෑම ලාභයක් හෝ පාඩුවක්, එම හඳුනා නොගැනීම සිදු කරනු ලබන වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ඇතුලත් කරනු ලැබේ.

1.2.2 කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ

කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ පිරිවැයෙහි දක්වනු ලැබේ. මෙම වියදම්, ප්‍රාග්ධනීකරණය වීමට ඇති ගොඩනැගිලි ඉදි කිරීමේ දී සෘජුවම හට ගන්නා ප්‍රාග්ධන ස්වරූපයක වියදම් වේ. භාවිතයේ පවතින ප්‍රාග්ධනය, භාවිතය සඳහා ලබා ගත හැකි අවස්ථාවේ දී, අදාළ දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වත්කම් වර්ගීකරණයට මාරු කරනු ලැබේ. එනම්, සමාගම විසින් අපේක්ෂිත අයුරින් ඒ සඳහා ක්‍රියාත්මක වීමට හැකි ආකාරයෙන් එය පිහිටා ඇති අවස්ථාවේ දී සහ අවශ්‍ය තත්ත්වයෙන් පවතින අවස්ථාවේදී, ය. කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ, යම් සමුච්චිත දුබලතා අලාභ අඩු කළ ණය ගැනුම් පිරිවැය ඇතුළත්ව, ගත් මිලට දක්වනු ලැබේ.

1.2.3 අස්පෘශ්‍ය වත්කම්

වත්කම වෙත ලැබෙන ඉදිරි ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 අස්පෘශ්‍ය වත්කම්හි පරිදි වත්කමෙහි පිරිවැය යථාර්ථවාදී ලෙස ඇගයීමේ හැකියාවක් පවති නම්, එය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. ඒ අනුව, මෙම වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත දුබලතා අලාභ අඩු කළ ගත් මිලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සඳහන් කරනු ලැබේ.

පරිගණක මෘදුකාංග වර්ෂ 4 ක කාල සීමාවක් පුරා සෘජු රේඛීය ක්‍රමය මත ක්‍රමක්ෂය කර ඇත.

වර්ෂ 4ක කාල සීමාවක් පුරා සෘජු රේඛීය ක්‍රමය මත විෂය මාලා පරිපාටි සංවර්ධනය කිරීමේ පිරිවැය ලියා අස්කර තිබේ.

1.2.4 භාණ්ඩ ලේඛන

කල් ඉකුත් වූ සහ අඩු ක්‍රියාකාරී අයිතම සඳහා නිසි ඉඩ ලබා දීමෙන් අනතුරුව, සාමාන්‍ය පිරිවැය යටතේ භාණ්ඩ ලේඛන ඇගයීම පළමුව පැමිණ පළමුව පිටවන පදනම **(FIFO)** මත සිදු කරනු ලැබේ. ලබා ගත හැකි දළ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොළ තුළ, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන මිලයි.

භාණ්ඩ ලේඛන වත්මන් ස්ථානයට සහ තත්ත්වයට රැගෙන ඒමේදී දරනු ලබන පිරිවැය, පහත සඳහන් සූත්‍ර භාවිත කරමින් ගිණුම් ගත කරනු ලැබේ : -

අමු ද්‍රව්‍ය	- පිරිවැයට
කෙරෙමින් පවතින වැඩ	- පිරිවැයට
නිම කළ භාණ්ඩ සහ	- සෘජු ද්‍රව්‍ය සහ සෘජු ශ්‍රම පිරිවැය යටතේ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව පදනම්ව ස්ථිර නිෂ්පාදිතයේ යෝග්‍ය සමානුපාතිකයක් සඳහා වියදම් වෙන් කිරීම් සිදු කරනු ලබයි.

ලබා ගත හැකි දළ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොළ තුළ, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන ඇස්තමේන්තු ගත විකුණුම් මිලයි.

1.2.5 වත්කම් දුබලතාවයට පත්වීම

දුබලතාවයට පත්වීම පිළිබඳ යම් සඳහනක් වේ දැයි නිර්ණය කිරීම සඳහා සෑම වාර්තා කරනු ලබන දිනකදීම වත්කම්හි ප්‍රවාහන පිරිවැය සමාලෝචනය කරනු ලැබේ. එවැනි සඳහනක් වුවහොත්, නැවත ලබා ගත හැකි වත්කම් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. දුබලතාවයට අලාභයක් හඳුනා ගනු ලබන්නේ, යම් වත්කමක ප්‍රවාහන පිරිවැය හෝ මුදල් ජනනය කිරීමේ ඒකකය, එහි නැවත ලබා ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන්නේ නම් ය. නැවත ලබා ගත හැකි ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා භාවිත කරන ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදු වී ඇත්නම්, දුබලතා අලාභය නැවත හරවාලනු ලැබේ.

1.2.6 මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 යටතේ පවත්නා මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ, ණය සහ ලැබිය යුතු, කල් පිරීමට නියමිත ආයෝජන, විකිණීමට ඇති මූල්‍ය වත්කම් හරහා සාධාරණ අගයක් යටතේ වන මූල්‍ය වත්කම් ලෙස හෝ යෝග්‍ය පරිදි, වලදායී සිමාවක් තුළ සිමා කිරීමේ උපකරණ ලෙස සලකනු ලබන ව්‍යුත්පන්න ලෙස හෝ වර්ගීකරණය කරනු ලැබේ. සමාගම විසින් පළමු අවස්ථාවේදී ම, සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය පිළිබඳව නිර්ණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකම් අතිරික්තය යටතේ හඳුනා ගනු ලබන්නේ, ගණුදෙණු පිරිවැය සඳහා සෘජුවම බලපෑම් කරනු ලබන, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයක් යටතේ වත්කම් නොවනු ලබන අවස්ථාවකදී ය.

සමාගම විසින්, ඔවුන් සිය සමාගම ස්ථාපිත කළ දිනයේ සිට ණය, ලැබිය යුතු සහ තැන්පතු හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ දක්වා ඇති වත්කම් ඇතුලත්ව) මූලිකව හඳුනා ගනු ලබන්නේ, වෙළඳ ගිවිසුමෙහි ගිවිසුම්ගත විධිවිධාන සඳහා සමාගම විසින් පාර්ශ්වකරුවකු වනු ලබන වෙළඳ දිනයේදී ය.

වත්කමකින් ලැබෙන මුදල් ප්‍රවාහ සඳහා ගිවිසුම්ගත අයිතීන් කල් ඉකුත් වූ විට, සමාගම විසින් එම මූල්‍ය වත්කම බැහැර කරනු ලබන අතර, එමඟින් මූල්‍ය වත්කම් මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබා ගැනීම උදෙසා, සාරානුකූලව මූල්‍ය වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා දෙනු ලබන ගණුදෙණුවක් හරහා එම අයිතිය මාරු කරනු ලැබේ. සමාගම විසින් ඇති කරනු ලබන හෝ රඳවා තබා ගනු ලබන, පවරන ලද මූල්‍ය වත්කම්හි ඕනෑම පොලියක්, වෙන් වෙන් වශයෙන් වත්කමක් හෝ වගකීමක් සේ හඳුනා ගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ වගකීම් කපා හැරීමක් වන අතර, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ එම ශුද්ධ අගය ඉදිරිපත් කරනු ලබන්නේ, එම අගයන් කපා හැරීමට සමාගම සතුව නෛතික අයිතියක් පවතින විට සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට හෝ වත්කම අත්පත් කොට ගෙන, ඒ හා සමගාමීව වගකීම නිරවුල් කිරීමට අපේක්ෂා කරන්නේ නම් පමණකි.

සමාගමේ මූල්‍ය වත්කම් තුළ මුදල්, කෙටි කාලීන ආයෝජන, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ ඇතුලත් වේ.

අ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම් තුළ වෙළඳාම සඳහා දරන ලද මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනා ගැනීම මත වර්ගීකරණයට ලක් කරන ලද මූල්‍ය වත්කම් ඇතුලත් වේ. මූල්‍ය වත්කම් වෙළඳාම සඳහා දරන ලද්දේ යයි වර්ගීකරණය කරනු ලබන්නේ, ආසන්නතම කාල සීමාව තුළදී විකිණීමේ හෝ නැවත මිලදී ගැනීමේ අරමුණින්, එම වත්කම් අත්පත් කරගනු ලබන්නේ නම් ය.

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූල්‍ය වත්කම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායම හෝ මූල්‍ය වියදම තුළ හඳුනා ගනු ලබන සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් සමඟ සාධාරණ වටිනාකම යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ දක්වාලනු ලැබේ.

සමාගම විසින් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනා ගැනීම මත කිසිදු මූල්‍ය වත්කමක් වර්ගීකරණය කර නොමැත.

ආ. ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු, ක්‍රියාකාරී වෙළඳපොළක් තුළ මතු කොට දක්වා නොමැති, ස්ථිර හෝ ලැබේ යයි සැලකිය හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ඇගයීමෙන් අනතුරුව, භායන අඩු කර ඵලදායී පොලි අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ පසුව අගයනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ, අත්පත් කරගැනීම මත ලද වට්ටම් හෝ වාරික සහ ඵලදායී පොලි අනුපාතයෙහි වැදගත් කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගැනීමෙනි. ඵලදායී පොලි අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මූල්‍ය ආදායම තුළ හඳුනා ගනු ලැබේ. දුබලත්වය හේතුවෙන් පැන නගින අලාභ, මූල්‍ය පිරිවැයෙහි සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

ලැබිය යුතු වෙළඳ ආදායම්, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, වෙනත් ලැබිය යුතු සහ මුදල් සහ මුදල් සමාන දෑ ආදියෙන් ණය සහ ලැබිය යුතු ආදායම් සමන්විත වේ.

ඇ. කල් පිරීමට නියමිත ආයෝජන

ස්ථිර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහ ස්ථිර කල් පිරෙන තැන්පතු හා බැඳි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, සමාගම විසින් ධනාත්මක අදහසකින් පසු වන සහ කල් පිරෙන තෙක් ඒවා රඳවා තබා ගැනීමේ හැකියාව සමාගම සතු වූ විට, කල් පිරීමට නියමිත ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික ඇගයීමෙන් අනතුරුව, දුබලතා ඌණ ඵලදායී පොලි අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි කල් පිරීමට නියමිත ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය යටතේ අගයනු ලැබේ. ඵලදායී පොලි අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මූල්‍ය ආදායම තුළ හඳුනා ගනු ලැබේ. දුබලත්වය හේතුවෙන් පැන නගින අලාභ, මූල්‍ය පිරිවැයෙහි සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

රජයේ සුරුකුම් පත් සහ ස්ථිර තැන්පතුවල කරනු ලබන ආයෝජන, කල් පිරීමට නියමිත ආයෝජන යටතේ වර්ගීකරණය කරනු ලැබ ඇත.

ඈ. විකිණීමට හැකි මූල්‍ය ආයෝජන

විකිණීමට හැකි ලෙස හෝ ඉහත සඳහන් මූල්‍ය වත්කම් වර්ගීකරණ කිසිවක් තුළ වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, විකිණීමට හැකි මූල්‍ය වත්කම් වේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, එම වත්කම් සාධාරණ වටිනාකම හා එහි වෙනස්කම් අනුව අගයනු ලබන අතර, දුබලතා අලාභ හැර වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනා ගනු ලබන අතර, අරමුදල් සහ සංචිත වල තැන්පත් කර ඇති සාධාරණ වටිනාකමින් ඉඳිරිපත් කරනු ලැබේ. විකිණීමට හැකි ණය සුරුකුම් මත පොලි ආදායම ඵලදායී පොලි අනුපාත ක්‍රමවේදය භාවිත කරමින් ගණනය කරනු ලබන අතර, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලැබේ. යම් ආයෝජනයක් හඳුනා ගනු නොලැබූ විට, අරමුදල් හා සංචිත තුළ සමුච්චිත ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ ගිණුමෙහි නැවත වර්ගීකරණය කරනු ලැබේ.

මූලික හඳුනා ගැනීම මත, සමාගම විසින් කිසිදු මූල්‍ය වත්කමක් විකිණීමට හැකි ආයෝජනයක් ලෙස හඳුනා ගනු ලැබ නොමැත.

1.2.7 මූල්‍ය වත්කම් දුබලත්වයට පත්වීම

සමාගම විසින් සෑම වාර්තා කරනු ලබන දිනකදීම, මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුබලත්වයට පත්ව ඇති බවට භරයාත්මක සාක්ෂි පවතිදැයි අගයනු ලබන අතර, එවැනි දුබලත්වයක් සිදු වී ඇත්නම්, එම දුබල වී ඇති ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ, වත්කම් දැරීමේ වටිනාකම සහ ඇස්තමේන්තු ගත ඉඳිරි මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගනිමිනි.

1.2.8 මුදල් හා මුදල් සමානයන්

අතැති මුදල්, බැංකු තැන්පතු සහ නැවත මිලදී ගැනීමේ ගිවිසුම් යනාදියෙන් මුදල් සහ මුදල් සාම්‍යයන් සමන්විත වේ.

"සෘජු නොවන ක්‍රමවේදය" භාවිතා කරමින් සකස් කරනු ලැබ ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් සහ මුදල් සාම්‍යයන්ගේ අංගයක් ලෙස බැංකු අයිරාව ඇතුලත් කරනු ලැබේ.

1.3 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන වගකීම් වනුයේ, ඉල්ලීම මත හෝ වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයක් තුළ ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ය. වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයකට පසු ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ජංගම නොවන වත්කම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී, දත් සියලුම වගකීම් සලකා බලනු ලැබේ. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සාධනීය වගකීමක් සමාගම සතුවන අවස්ථාවේ දී, ප්‍රතිපාදන සහ වගකීම් හඳුනා ගනු ලබන අතර, මෙම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වනු ඇත.

1.3.1 සේවක ප්‍රතිලාභ

අ. විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

මෙම ප්‍රතිපාදන ගණනය කිරීමේදී භාවිත කරනු ලබන මූලික පූර්ව නිගමන තුළ පහත දැක්වෙන කරුණු ඇතුලත් වේ :

වට්ටම් අනුපාතය	12%
ඉදිරි වැටුප් වැඩිවීම් අනුපාතය	10%
කාර්ය මණ්ඩල පිරිවැටුම	02%
විශ්‍රාම ගැනීමේ වයස	අවුරුදු 55

සමාගම ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

ආ. නිශ්චිත දායකත්ව සැලැස්ම

නිශ්චිත දායකත්ව සැලැස්ම පශ්චාත් සේවා නියුක්ති සැලැස්මක් වන අතර, ඒ යටතේ ආයතනයක් විසින් වෙනත් යම් ආයතනයක් වෙත ස්ථිර දායකත්වයක් ගෙවනු ලබන අතර, අමතර වටිනාකමක් ගෙවීම සඳහා ඊට කිසිදු නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් නිමි නොවනු ඇත. නිශ්චිත දායකත්ව සැලැස්ම සඳහා වන දායකත්ව වෙනුවෙන් වන වගකීම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හිඟ ලෙස පෙන්නුම් කෙරෙන පරිදි සහ ඒවා නියමිත වන්නා වූ අවස්ථාවන්හි දී එම ප්‍රකාශයෙහි වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

ඇ. සේවක අර්ථසාධක අරමුදල

එක් එක් සේවකයකුගේ වැටුප මත සමාගම සහ සේවකයා විසින් පිළිවෙළින්, 12% හා 8% බැගින් වන පරිදි, අනුමත කරන ලද අර්ථසාධක අරමුදල වෙත සිය දායකත්වය සලසා දෙනු ලැබේ.

ඈ. සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් විසින් එක් එක් සේවකයකුගේ වැටුප මත 3% ක් වූ ප්‍රමාණයක් අනුව සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත සිය දායකත්වය සලසා දෙනු ලැබේ.

1.3.2 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ගත් මිල මත සඳහන් කරනු ලැබේ.

1.3.3 බදුකරණය

ලාභාංශ හෝ පොලි වලින් ලද, අතිරික්තය සහ ආදායම් හැර, සමාගමේ අතිරික්තය සහ ආදායම්, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි 7 ආ (ixiv) වගන්තිය යටතේ ආදායම් බදු වලින් නිදහස් කෙරේ.

1.3.4 කල් තබන ලද බදුකරණය

සමාගමේ අතිරික්තය සහ ආදායම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි 7 (ixiv) වගන්තිය යටතේ ආදායම් බදු වලින් නිදහස් කර ඇති හෙයින්, විලම්බිත බදු සඳහා විධිවිධාන සකස් කර නොමැත.

1.3.5 ප්‍රාග්ධන වගකීම් හා අවිනිශ්චිත වගකීම්

අවිනිශ්චිත වගකීම් යනු, ආර්ථික ප්‍රතිලාභ පැවරීම සිදු කළ නොහැකි හෝ නිසියාකාරව ගණනය කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන වගකීම් වලින් පමණක් පැවැත්ම සහතික කරනු ලැබිය හැකි වගකීම් ය.

මූල්‍ය ප්‍රකාශවලට සිදු කරන අදාළ සටහන්හි සමාගමේ ප්‍රාග්ධන වගකීම් සහ අවිනිශ්චිත වගකීම් අනාවරණය කරනු ලැබේ.

1.4 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

ප්‍රාග්ධන සංචිතය (ප්‍රාග්ධන ප්‍රදානවලට අදාළව)

වර්ෂ 2011 සිට සෞඛ්‍ය අමාත්‍යාංශය, කෙයා (CARE) ආයතනය සහ ශ්‍රී ලංකා දුම්කොළ සමාගම විසින් ස්ථිර වත්කම් මත වැය කරන ලද අරමුදල්, ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සලකනු ලැබ ඇති අතර, ඒ අනුව, වර්ෂය සඳහා සමස්ත ක්ෂය කිරීම් සඳහා හිලව් කිරීම සිදු කරමින්, මෙම විෂයන්ට අදාළ ක්ෂය කිරීම් අදාළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්වලට ඇතුලත් කරනු ලැබ ඇත.

1.4.1 ප්‍රදාන

යම් ප්‍රදානයක් ලැබෙන බවට සහ ඊට යා කොට ඇති කොන්දේසි හා අනුගත වනු ඇති බවට සාධාරණ සහතික වීමක් පවතින අවස්ථාවකදී රජයේ ප්‍රදාන හඳුනා ගනු ලැබේ.

සමාගම තුළ ඇති කෙරෙනු ලබන වියදම් වෙනුවෙන් ඒ වෙත පිරිනමනු ලබන ප්‍රදාන, එම වියදම් හඳුනා ගනු ලබන වර්ෂයේ ම විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ. යම් වත්කමක පිරිවැය සඳහා සමාගම වෙත ලබා දෙනු ලබන ප්‍රදාන, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

1.4.2 වියදම්

අ. ජනනය වූ පිරිවැය සහ සුවිශේෂී ආදායම් වර්ග ඉපැයීම් අතර සෘජු සබඳතාව මත පදනම්ව, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනා ගනු ලැබේ. සමාගමෙහි මෙහෙයුම් කටයුතුවල දී සහ කාර්යක්ෂම අවස්ථාවන්හි දී ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේ දී ඇති වන සියලුම වියදම්, එම වර්ෂය සඳහා අතිරික්තය ගණනය කිරීමේදී ආදායම්හි ප්‍රතිපාර්ශ්වීය ලෙස අය කරගනු ලැබ ඇත.

1.4.3 මූල්‍ය වියදම් / ආදායම්

ආයෝජනය කරන ලද අරමුදල් සඳහා උපචිත පදනම මත ලද පොලියෙන් මූල්‍ය ආදායම සමන්විත වේ.

1.5 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති 7 හා අනුගතව සකස් කරනු ලැබ ඇත.

1.6 වාර්තා කිරීමේ කාල සීමාව අවසානයේ සිදුවීම්

වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසුව මූල්‍ය ප්‍රකාශ තුළ ගැළපුම් හෝ අනාවරණ අවශ්‍ය වන්නාවූ සැලකිය යුතු සිදුවීම් කිසිවක් නොමැත.

1.7 නිකුත් කරන ලද, එහෙත් තවමත් ක්‍රියාත්මකභාවයේ නොමැති ප්‍රමිතීන්

සමාගමෙහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශ නිකුත් කළ දින දක්වා නිකුත් කරන ලද, එහෙත් තවමත් ක්‍රියාත්මකභාවයේ නොමැති ප්‍රමිතීන් පහත දැක්වේ. නිකුත් කරන ලද ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණ ලේඛනය යනු, ඉදිරි දිනකදී අදාළ කරගනු ලබන අවස්ථාවක දී අනාවරණය කිරීම්, මූල්‍ය තත්ත්වය හෝ කාර්ය සාධනය මත බලපෑමක් ඇති කෙරෙනු ඇති බවට සමාගම විසින් සාධාරණතාව අපේක්ෂා කරනු ලබන ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණ වේ. මෙම ප්‍රමිතීන් බලාත්මක වනු ලබන අවස්ථාවේ දී, එම ප්‍රමිතීන් අදාළ කරගනු ලැබීමට සමාගම විසින් අපේක්ෂා කරනු ලබයි.

අ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 මූල්‍ය උපකරණ :

වර්ගීකරණය සහ ගණනය කිරීමේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 මඟින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 ආදේශ වනු ලබන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 හි අර්ථ නිරූපිත මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ ගණනය කිරීම සඳහා අදාළ කරගනු ලැබේ. මෙම ප්‍රමිතියෙහි අනිවාර්ය බලාත්මක දිනය කල් තබා ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 හි පළමු අදියර අදාළ කර ගැනීම මඟින් සමාගමෙහි මූල්‍ය වත්කම් වල වර්ගීකරණය සහ ගණනය කිරීම මත බලපෑමක් ඇති කරනු ලබන නමුත්, වාස්තවිකව මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ ගණනය කිරීම මත කිසිදු බලපෑමක් ඇති නොකරනු ලැබේ. විස්තරාත්මක ඉදිරිපත් කිරීමක් ඉදිරිපත් කිරීම පිණිස, නිකුත් කරනු ලැබූ විට, සමාගම විසින් අනෙකුත් අදියරයන් හා එක්ව ගෙන එහි බලපෑම ගණනය කරනු ලැබේ.

1.8 විකිණීම සඳහා තබා ගන්නා ලද ජංගම නොවන වත්කම්

නිරන්තර භාවිතය හරහා නොව මූලිකව, බැහැර කිරීම මඟින් නැවත ලබා ගැනීමට අපේක්ෂිත ජංගම නොවන වත්කම්, විකිණීම සඳහා තබා ගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. විකුණුම සඳහා තබා ගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කිරීමට පූර්ව වහාම, සමාගමෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගතව මෙම වත්කම් නැවත ගණනය කරනු ලැබේ. ඉන් පසුව, එම වත්කම්හි වටිනාකමට අඩු වටිනාකම සහ විකුණුම් පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම යටතේ එම වත්කම් ගණනය කරනු ලැබේ. විකිණීම සඳහා තබා ගන්නා ලද, මූලික වර්ගීකරණය කිරීම මත හායන පාඩු සහ නැවත ගණනය කිරීම මත ලද පසු කාලීන ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලැබේ. කිනම් හෝ සමුච්චිත හායන පාඩුවක් ඉක්මවා ලැබීම් හඳුනා ගනු නොලැබේ.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2018 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා

	2018/12/31 රු. ශත.	2017/12/31 රු.
02. ආදායම		
අයභාරය	2,215,278,046.70	1,894,082,548
ක්ෂය වීම්	56,379,502.03	55,316,859
සුපෝෂ විකුණුම්	523,214,500.95	232,322,965
හයිලන්ඩ් නිෂ්පාදන විකුණුම්	10,773,160.00	1,983,925
ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලිය නිෂ්පාදන විකුණුම්	672,070.00	-
එස්. ඩී. කේ. නිෂ්පාදන විකුණුම්	400,850.00	-
	2,806,718,129.68	**2,183,706,297**
03. පරිභෝජනයට සූදානම් නිෂ්පාදන වල පිරිවැය		
2018.01.01 වන දිනට නිමවූ නිෂ්පාදන	24,913,203.12	34,050,018
මුළු නිෂ්පාදන පිරිවැය	2,210,858,725.04	1,895,472,227
2018.12.31 වන දිනට නිමවූ නිෂ්පාදන	(5,010,672.00)	(24,913,203)
	2,230,761,256.16	**1,904,609,041**
04. විකුණුම් පිරිවැය		
2018.01.01 වන දිනට ශේෂය	13,650,007.36	-
ලැබීම් - සුපෝෂ	369,851,070.93	157,741,777
විකුණුම් - හයිලන්ඩ් නිෂ්පාදන	9,146,060.75	1,974,605
ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලිය නිෂ්පාදන විකුණුම්	539,112.50	-
එස්. ඩී. කේ. නිෂ්පාදන විකුණුම්	428,161.80	-
විකුණුම් - ඇසුරුම් ද්‍රව්‍ය	38,000,336.23	21,993,438
	431,614,749.57	181,709,820
2018.12.31 වන දිනට ශේෂය	(7,046,999.85)	(13,650,007)
	424,567,749.72	**168,059,812**
05 වෙනත් ආදායම්		
අපතය විකුණුම්	22,558,356.65	17,681,221
නිවාස ණය පොලි	1,294,268.63	964,732
භාණ්ඩාගාර බිල්පත් මත පොලි ආදායම්	7,012,927.20	8,027,274
ස්ථාවර තැන්පතු පොලි	5,130,950.89	1,375,210
වෙනත්	1,817,346.73	933,894
	37,813,850.10	**28,982,331**
06 විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය		
ප්‍රවාහන අය කිරීම්	14,107,435.66	10,696,895
සුපෝෂ ආරම්භ කිරීමේ වියදම්	-	6,148,461
ප්‍රදර්ශනාගාර වියදම්	294,040.00	145,048
මුද්‍රණ හා වෙළඳ දැන්වීම්	4,005,373.07	4,423,220
විකුණුම් කොමිස් හා වෙනත් වියදම්	56,136.95	-
ක්ෂය වීම්	1,248,000.00	-
	19,710,985.68	**21,413,625**

	2018/12/31 රු. ශත.	2017/12/31 රු.
07. පරිපාලන වියදම්		
වැටුප්	9,652,304.99	8,657,441
සේවක අර්ථසාධක අරමුදල	2,191,187.73	1,918,230
සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල	484,801.52	430,309
අතිකාල දීමනා	2,356,408.34	1,854,989
දීමනා	3,709,809.64	4,402,694
අනියම් වේතන	1,032,524.97	189,533
අනියම් වේතන මත සේවක අර්ථසාධක අරමුදල	219,499.92	41,333
අනියම් වේතන මත සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල	32,924.92	6,800
කළමනාකරණ දීමනා	8,366,493.42	5,478,402
කාර්යමණ්ඩල සුබසාධනය	3,050,092.39	2,054,131
බදු හා කුලී	518,941.29	320,503
කාර්යාල උපකරණ නඩත්තු	900,647.37	1,456,958
ආරක්ෂක ගාස්තු	7,375,733.75	6,955,722
මෝටර් වාහන ඉන්ධන	2,782,471.10	1,823,139
අලුත්වැඩියා හා නඩත්තු - වාහන	2,155,378.08	1,748,065
ලිපි ද්‍රව්‍ය	1,806,301.82	2,132,294
තැපැල් ගාස්තු	355,000.00	271,405
දුරකථන ගාස්තු	550,012.67	605,073
කාර්යමණ්ඩල පුහුණු කිරීමේ ගාස්තු	13,010,300.28	4,342,465
නෛතික හා වෘත්තිය ගාස්තු	882,495.00	587,475
බලපත්‍ර හා රක්ෂණ ගාස්තු	1,043,117.36	1,034,620
වෛද්‍ය සහ සනීපාරක්ෂණ	532,507.95	469,716
ගමන් වියදම්	210,150.00	83,600
පරිත්‍යාග	235,000.00	297,000
නිල ඇඳුම් - එම්. කේ. ටී	88,000.00	-
දිරි දීමනා	9,723,096.67	-
ක්ෂය වීම්	6,075,433.94	7,398,375
	79,340,635.12	**54,560,274**
08 මූල්‍ය හා වෙනත් වියදම්		
බැංකු ගාස්තු	53,190.56	39,580
පරිත්‍යාග	705,000.00	124,000
ව්‍යපහරණ අලාභ	10,639,533.23	29,689
නැවත සකස් කිරීමේ අලාභ	112,656.25	2,356
	11,510,380.04	**195,624**
09 මිල දී ගැනීම්		
ඉරිඟු	714,643,327.58	646,307,108
සෝයා	512,146,729.05	383,301,820
කිරි පිටි	373,102,650.00	346,032,000
ඛනිජ ලවණ	43,207,050.00	62,490,493
විටමින්	80,172,853.75	35,352,754
පොලිතින් බෑග්	7,001,766.00	21,139,875
පොලිතින් රිල්	50,890,355.29	49,234,014
ක්‍රාෆ්ට් කඩදාසි බෑග්	32,006,558.74	20,335,807
ටිවයින් නූල්	233,082.20	392,455
	1,813,404,372.61	**1,564,586,324**

	2018/12/31 රු. ශත.	2017/12/31 රු.
10 සෘජු ශ්‍රම සහ කළමනාකරණ පිරිවැය		
වැටුප්	61,853,761.71	53,797,906
සේවක අර්ථසාධක අරමුදල	9,744,725.72	8,770,169
සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල	2,434,629.04	2,179,510
අතිකාල දීමනා	48,162,231.35	45,254,998
දීමනා	28,343,241.80	32,668,217
පාරිතෝෂික	5,663,671.10	9,185,605
සේවා පර්යන්ත ගෙවීම්	429,854.08	275,819
නිල ඇඳුම් සහ සේදුම් වියදම්	4,185,068.82	3,008,960
තේ හා වෙනත්	3,906,123.00	3,309,276
මුර මාරු හා ආහාර දීමනා	2,197,984.00	2,108,281
වෛද්‍ය සහ සනිපාරක්ෂණ	1,017,481.86	804,335
අනියම් හා කොන්ත්‍රාත් සේවක වැටුප්	5,576,686.50	5,303,976
අනියම් හා කොන්ත්‍රාත් සේවක වැටුප් මත සේවක අර්ථසාධක අරමුදල	878,297.24	316,485
අනියම හා කොන්ත්‍රාත් සේවක වැටුප් මත සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල	204,391.37	115,535
සුබසාධන පිරිවැය	205,787.56	818,492
දැරී දීමනා	12,457,819.51	10,684,319
	187,261,754.66	**178,601,881**
11 කම්හල් පොදු කාර්ය පිරිවැය		
විදුලි ජනකය සඳහා ඉන්ධන	41,398,428.38	29,923,937
කම්හල් නඩත්තු ගාස්තු	66,045.95	64,081
පිරියත හා යන්ත්‍රෝපකරණ නඩත්තු	22,777,450.58	20,897,238
විද්‍යාගාර වියදම්	3,678,310.95	1,962,475
විදුලි	32,717,280.45	28,037,764
ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු	2,774,122.08	3,497,475
වෙනත් සේවා හා නඩත්තු	8,250,042.70	8,505,276
උද්‍යාන නඩත්තුව	58,880.00	70,380
භායන අලාභ	87,285.00	66,287
ක්ෂය වීම්	50,340,691.10	48,776,292
	162,148,537.19	**141,801,206**

12. දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය / ප්‍රත්‍යාගණනය	2018.01.01 වන දිනට ශේෂය	එකතු කිරීම්	ගැළපුම් - 2018	ව්‍යපහරණ - 2018	2018.12.31 වන දිනට ශේෂය
ඉඩම්	220,000,000.00	-	-	-	220,000,000.00
ගොඩනැගිලි	134,724,456.26	2,357,390.75	-	(10,094,074.95)	126,987,772.06
පිරියත හා උපකරණ	397,077,324.77	44,607,195.80	6,516,736.20	(4,540,619.34)	443,660,637.43
මෝටර් රථ	25,695,000.00	4,800,000.00	-	-	30,495,000.00
උපකරණ හා අමිපන්න	13,977,977.03	750,812.51	(6,659,857.99)	(361,697.50)	7,707,234.05
විද්‍යාගාර උපකරණ	8,492,747.85	1,092,549.02	24,000.00	(1,632,540.00)	7,976,756.87
කෘෂිකාර්මික උපකරණ	138,650.00	-	(108,150.00)	(30,500.00)	-
විදුලි වැඩ	6,159,034.76	-	(116,300.00)	-	6,042,734.76
කාර්යාල උපකරණ	17,803,882.38	613,229.99	(8,060,268.12)	(1,803,154.50)	8,553,689.75
ගෘහ භාණ්ඩ හා උපාංග	6,745,017.31	65,850.01	867,001.01	(76,410.00)	7,601,458.33
පරිගණක හා වෙනත් දෘඩාංග	-	737,800.00	7,536,838.88	-	8,274,638.88
	830,814,090.36	**55,024,828.08**	**(0.02)**	**(18,538,996.29)**	**867,299,922.13**

සමුච්චිත ක්ෂය කිරීම්	2018.01.01 දිනට ශේෂය	වර්ෂය සඳහා අය	ගැළපුම් - 2018	ව්‍යපහරණ - 2018	2018.12.31 වන දිනට ශේෂය
ගොඩනැගිලි	21,382,098.92	6,274,510.43		(2,607,636.03)	25,048,973.32
පිරියත හා උපකරණ	98,162,958.06	41,696,736.22	5,938,470.23	(2,439,807.66)	143,358,356.85
මෝටර් රථ	16,776,500.00	3,642,000.00		-	20,418,500.00
උපකරණ හා අමිපන්න	11,398,787.99	639,157.24	(6,069,394.67)	(361,550.82)	5,606,999.74
විද්‍යාගාර උපකරණ	2,930,292.60	740,289.55	5,400.00	(843,479.00)	2,832,503.15
කෘෂිකාර්මික උපකරණ	71,635.83	-	(55,877.50)	(15,758.33)	-
විදුලි වැඩ	2,596,943.67	989,997.66	(46,480.03)	-	3,540,461.30
කාර්යාල උපකරණ	5,893,435.19	828,158.37	(2,411,043.97)	(948,436.92)	3,362,112.67
ගෘහ භාණ්ඩ හා උපාංග	2,087,892.53	757,088.96	275,800.75	(40,837.08)	3,079,945.16
පරිගණක හා වෙනත් දෘඩාංග	-	1,930,889.72	2,363,310.47	-	4,294,200.19
	161,300,544.79	**57,498,828.15**	**185.28**	**(7,257,505.84)**	**211,542,052.38**

ලියා අඩු කළ අගයන්	2018.12.31 වන දිනට ශේෂය රු. ශත.	2017.12.31 වන දිනට ශේෂය රු.
ඉඩම්	220,000,000.00	220,000,000
ගොඩනැගිලි	101,938,798.74	113,342,357
පිරියත හා උපකරණ	300,302,280.58	298,914,367
මෝටර් රථ	10,076,500.00	8,918,500
උපකරණ හා අමිපන්න	2,100,234.31	2,579,189
විද්‍යාගාර උපකරණ	5,144,253.72	5,562,455
කෘෂිකාර්මික උපකරණ	-	67,014
විදුලි වැඩ	2,502,273.46	3,562,091
කාර්යාල උපකරණ	5,191,577.08	11,910,447
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	4,521,513.17	4,657,125
පරිගණක හා වෙනත් දෘඩාංග	3,980,438.69	-
	655,757,869.75	**669,513,546**

	2018.12.31 වන දිනට ශේෂය රු. ශත.	2017.12.31 වන දිනට ශේෂය රු.
13. අස්පෘෂ්‍ය වත්කම්		
පිරිවැය	661,187.57	661,188
සමුච්චිත ක්ෂය කිරීම්	(495,890.67)	(330,594)
ලියා අඩු කළ අගය	**165,296.90**	**330,594**
14. කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ		
සේදුම් කාමර ඉදිකිරීම	517,145.26	-
ගරාජ හා විවේක කාමර ඉදිකිරීම	21,996,484.14	-
	22,513,629.40	**-**

15 වට්ටෝරු භාණ්ඩ	2018/12/31 රු. ශත.	2017/12/31 රු.
අමු ද්‍රව්‍ය		
ඉරිඟු	16,845,955.21	23,778,878
සෝයා	39,872.25	61,829,570
කිරි පිටි	47,022,150.00	44,185,500
ඛනිජ ලවණ	4,074,650.00	6,175,200
විටමින්	11,471,825.00	895,879
	79,454,452.46	**136,865,026**
ඇසුරුම් අමුද්‍රව්‍ය		
පොලිතින් බෑග්	277,020.00	2,851,425
පොලිතින් ටිල්	4,558,058.78	6,478,914
ක්‍රාෆ්ට් කඩදාසි බෑග්	4,121,568.00	442,319
ටිවයින් නූල්	-	146,776
	8,956,646.78	**9,919,433**
වෙනත්		
ඩීසල්	3,138,130.00	2,490,425
ඉංජිනේරු ගබඩා	10,922,253.77	9,856,217
	14,060,383.77	**12,346,642**
කෙරෙමින් පවත්නා වැඩ		
අමු ද්‍රව්‍ය		
ඉරිඟු	10,858,790.67	535,500
සෝයා	-	748,000
කිරි පිටි	997,500.00	263,250
ඛනිජ ලවණ	72,518.00	16,600
විටමින්	115,041.40	68,914
ඇසුරුම් අමුද්‍රව්‍ය		
පොලිතින් බෑග්	164,255.76	200,583
පොලිතින් ටිල්	155,064.40	345,543
ක්‍රාෆ්ට් කඩදාසි බෑග්	242,402.32	201,906
ටිවයින් නූල්	-	8,634
	12,605,572.55	**2,388,929**
නිමි භාණ්ඩ		
ළමා	2,927,067.56	17,521,889
මාතෘ	2,083,604.44	7,391,314
	5,010,672.00	**24,913,203**
අලෙවි අංශය		
සුපෝෂ	856,168.93	8,333,724
ඇසුරුම් අමුද්‍රව්‍ය	5,846,977.92	5,140,009
හයිලන්ඩ් නිෂ්පාදන	343,853.00	176,274
	7,046,999.85	**13,650,007**
එකතුව	**127,134,727.41**	**200,083,241**

	2018/12/31 රු. ශත.	2017/12/31 රු.
16 වෙළඳ හා වෙනත් ලැබීම්		
ණයගැතියෝ	146,994,281.36	59,264,121
ණයගැතියෝ - අලෙවි	29,753,237.30	45,902,857
අත්තිකාරම් සහ පූර්ව ගෙවීම්	180,999.69	19,213,183
තැන්පතු	1,976,000.00	1,876,000
නිවාස ණය - වත්කම්	24,798,513.71	13,707,573
නිවාස ණය - ආපදා	8,630,286.18	9,350,360
උත්සව අත්තිකාරම්	221,250.00	25,000
විනෝද චාරිකා අත්තිකාරම්	225,800.00	11,500
	212,780,368.24	**149,350,593**
17 මුදල් හා මුදල් සමාන දෑ		
අතැති මුදල්	20,000.00	20,000
ලංකා බැංකුව, ජා-ඇල ගිණුම් අංක 71324617	29,691,454.54	13,530,026
ලංකා බැංකුව, ජා-ඇල ගිණුම් අංක 80306903	153,631,018.80	45,902,793
භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජන	92,580,625.00	92,988,272
ස්ථාවර තැන්පත් මත ආයෝජන	59,343,194.89	47,775,210
	335,266,293.23	**200,216,301**

18 ප්‍රකාශිත ප්‍රාග්ධනය

අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක ප්‍රතිඵලයක් ලෙස, ත්‍රිපෝෂ සමාගමේ කළමනාකාරිත්වය, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සම්පූර්ණ රජය සතු පොදු සීමිත සමාගමක් වෙත පවරනු ලැබ ඇත. ඒ අනුව, රු. 304,600,000/= ක (රුපියල් තුන් සිව් මිලියන හයසිය දහසක්) ප්‍රකාශිත ප්‍රාග්ධනය සහිතව 2010 සැප්තැම්බර් මස 17 වන දින ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් නමැති සමාගම සංස්ථාපනය කරන ලදී.

19 විලම්බිත බැරකම්		
වර්ෂය මුල ශේෂය	375,554,449.17	380,421,185
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	47,609,531.03	50,450,123
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන අත්තිකාර	23,301,129.39	19,936,618
අඩු කළා : වර්ෂය සඳහා ක්ෂය කිරීම් ගාස්තු	(56,379,502.03)	(55,316,859)
වර්ෂ අවසානයේ ශේෂය	**390,085,607.56**	**395,491,067**
20 ප්‍රත්‍යාගණන සංචිත		
වර්ෂය මුල ශේෂය	306,378,657.65	307,170,028
ව්‍යපහරණ වත්කම් මත ප්‍රත්‍යාගණන ලාභ / අලාභ	-	(791,370)
වර්ෂය අවසානයේ ශේෂය	**306,378,657.65**	**306,378,658**
21 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්		
වර්ෂය මුල ශේෂය	42,956,779.00	37,858,776
අඩු කළා : වර්ෂය තුළ ගෙවීම්	(3,721,918.00)	(4,087,601)
2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන	5,663,671.10	9,185,605
වර්ෂය අවසානයේ ශේෂය	**44,898,532.10**	**42,956,779**
වට්ටම් ගත අනුපාතය	12%	12%
ඉඳිරි වැටුප් වර්ධක අනුපාතය	10%	10%
කාර්ය මණ්ඩල පිරිවැටුම්	2%	2%
විශ්‍රාම ගැනීමේ වයස	අවුරුදු 55	අවුරුදු 55

	2018/12/31 රු. ශත.	2017/12/31 රු.
22 වෛද්‍යාධාර අරමුදල		
වර්ෂය මුල ශේෂය	176,422.35	238,679
වර්ෂය තුළ දායකවීම්	231,068.00	98,600
වර්ෂය තුළ ගෙවීම්	(198,043.57)	(160,857)
වර්ෂය අවසානයේ ශේෂය	**209,446.78**	**176,422**
23 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු		
ණය නිමියන්	133,075,718.12	59,782,065
උපචිත වියදම්	52,133.30	506,732
මුදල් අග්‍රිමය - සෞඛ්‍ය අමාත්‍යාංශය	9,775.92	-
ආපසු ගෙවනු ලබන තැන්පතු	54,243,237.50	48,503,238
සෞඛ්‍ය අමාත්‍යාංශය	2,358,590.90	22,033,801
	189,739,455.74	**130,825,836**
24 පූර්ව වර්ෂ ගැළපුම්		
ලැබිය යුතු ගිණුම්වලට අදාළ ගැළපුම්	-	27,633,145
වියදම් ගිණුම්වලට අදාළ ගැළපුම්	-	235,139
	-	**27,868,284**

25 ප්‍රාග්ධන ප්‍රදාන හා සම්බන්ධ ක්ෂය කිරීම්

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කර ඇති ස්ථාවර වත්කම්වලට අදාළ ක්ෂය කිරීම්, එම වර්ෂයේ

මුළු ක්ෂය කිරීමේ ගාස්තු අඩු කරමින් අදාළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට අයගත කරගනු ලැබ ඇත.

26 බැඳියා සහ අවිනිශ්චිතතා

වාර්තා කරනු ලබන දිනයේදී කිසිදු සැලකිය යුතු බැඳියාවක් හෝ අවිනිශ්චිතතාවක් නොපැවතණි.

27 සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්

ප්‍රධාන පෙළේ කළමනාකරණ නිලධාරීන් හා පවත්නා ගනුදෙනු

සමාගමෙහි ප්‍රධාන පෙළේ කළමනාකරණ නිලධාරීන් වනුයේ, එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෝ ය. සභා රැස්වීම් දිමනා හා ප්‍රවාහන දිමනා වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සහ විගණන හා කළමනාකරණ කමිටුව වෙත 2018 වර්ෂය තුළ පිළිවෙළින් රු. 525,000 හා රු. 138,000 ක් වූ මුදල් ප්‍රමාණ ගෙවන ලදි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	එව්එස්එම්/එෆ්/ එස්එල්ටීසී/06/2018/08	මගේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2019 ජූලි 09 දින

සභාපති

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි 20 ඡේදය ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය භාවිතයෙන් පිළියෙල කරන විට ලාභයට ගැලපිය යුතු වන්කම් හානිකරණ අලාභය රු.87,285 ක්, රාජ්‍ය ප්‍රදානවලට අදාළ ක්‍රමක්ෂය රු.56,379,502 ක් හා ආයෝජන පොලී ආදායම රු.5,183,872 ක් වර්ෂයේ ශුද්ධ ලාභයට ගැලපීම් නොකර මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කර තිබුණි. තවද ප්‍රමිතයේ 21 ඡේදය ප්‍රකාරව, ස්ථාවර තැන්පත්වල ආයෝජනය රු.9,400,000 ක්, ස්ථාවර තැන්පත් ආපසු ගැනීම රු.1,500,000 ක් හා මුදලින් ලද පොලී ආදායම රු.4,885,125 ක් මුදල් ප්‍රවාහයට ඇතුළත් කළ යුතු වුවත්, එම මුදල් ප්‍රවාහයන් අත්හැර ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කර තිබුණි. තවද මුදලින් ලැබී තිබුණු රාජ්‍ය ප්‍රදාන රු.70,910,660 ක් ගැලපීම් නොකර මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කර තිබුණි. එසේම මුදල් ප්‍රවාහයට ඇතුළත් කර තිබුණු ආයෝජන පොලී ආදායම රු.642,143 ක නිවැරදි බව තහවුරු කිරීමට අදාළ නිලධාරීන් අපොහොසත් විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.1,540,426 ක් වූ ස්ථාවර තැන්පතු පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණු අතර ඉකුත් වර්ෂයට අදාළ රු.1,286,504 ක් වූ ස්ථාවර තැන්පතු පොලී ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.

(ඇ) 2018 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් රු.1,597,121 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර 2019 වර්ෂයට අදාළව එම වර්ෂයේදී ගෙවා තිබුණු රු.91,425 ක් වූ වියදම් 2018 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් ගිණුමට හර කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරණ සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2007 අංක 7 දරණ සමාගම් පනතේ 163 (1) (ඇ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිළි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	විස්තරය
(අ)	2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 3 (අ) ඡේදය	2017 මාර්තු මාසයේ සිට "සුපෝෂ"නමින් නව නිෂ්පාදනයක් වෙළඳපොළට හඳුන්වා දෙමින් උපයා තිබුණු රු.120,543,597 ක ශුද්ධ ලාභය හා ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්වලින් උපයා තිබුණු රු.12,143,878 ක පොලී ආදායම මත ආදායම් බදු වගකීම ගණනය කර ගිණුම් ගත කිරීමටත් බදු ගෙවීමටත් කටයුතු කර නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 හා 757	සෑම වර්ෂයක් සඳහාම භාණ්ඩ සමීක්ෂණයක් සිදු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 7.2 ඡේදය	සමාගමේ පාලන පරිසරයේ ප්‍රධාන අංශයන් ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොතක් පිළියෙල කර නොතිබුණි.
(ii) 8.2.2 ඡේදය	අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගත යුතු වුවත්, සමාගම විසින් සිදුකර තිබුණු රු.59,343,195 ක ආයෝජනයන් සම්බන්ධයෙන් එම එකඟතාවය ලබා ගෙන නොතිබුණි.
(iii) 9.12 ඡේදය	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව වෛද්‍ය අරමුදලක් පිහිටුවා ක්‍රියාත්මක කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ශේෂය රු.209,447 ක් විය.
(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයේ 4.2.1 ඡේද	සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාලසටහන විධිමත් ලෙස පිළියෙල කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

  - සමාලෝචිත වර්ෂයේදී ගැබිණි හා කිරි දෙන මව්වරුන්ට හා ළදරුවන්ට නොමිලයේ නිකුත් කරන ත්‍රිපෝෂ අවශ්‍යතාවය ග්‍රෑම් 750 පැකට් 17,445,180 ක් වුවද, එම පැකට් 16,071,900 ක් පමණක් සපයා තිබුණි. ප්‍රධාන පරමාර්ථයෙන් බැහැරව ත්‍රිපෝෂ ග්‍රෑම් 750 පැකට් 1,373,280 ක් අඩුවෙන් සපයා තිබුණද, වාණිජ පරමාර්ථයෙන් වෙළඳපලට හඳුන්වා දී තිබුණු සුපෝෂ ග්‍රෑම් 100, ග්‍රෑම් 250, ග්‍රෑම් 500 හා ග්‍රෑම් 750 පැකට් පිළිවෙලින් 269,400 ක් 3,666,874 ක් 201,336 ක් හා 2,087,460 ක් වෙළඳපලට නිකුත් කර තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2017 හා 2018 වර්ෂවලදී රු.1,790,732 ක් හා රු.3,650,000 ක් වැය කර පිළිවෙලින් සේවක විවේක කාමරයක් හා බොයිලේරු කාමරයක් ඉදිකර තිබුණි. මෙම ඉදිකිරීම් දෙක සඳහා වූ ප්‍රසම්පාදනයන්වලදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු සුරක්ෂණ ලබාගෙන නොතිබුණි. තවද 5.4.4 මාර්ගෝපදේශයට පටහැනිව සේවක විවේක කාමරය ඉදිකිරීම සඳහා අත්තිකාරම් සුරක්ෂණයක් ලබා ගැනීමකින් තොරව සියයට 50 ක අත්තිකාරමක් ලබාදී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 මාර්ගෝපදේශය ප්‍රකාරව වගකීම් කාලය ආවරණය වන පරිදි රඳවා ගැනීමේ මුදලක් තබා ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සෝයා බෝංචි අවශ්‍යතාවය වූ මෙට්‍රික් ටොන් 6,000 ක් සපයා ගැනීමේ ප්‍රසම්පාදනය සඳහා 2017 වර්ෂයේදී පත්කර තිබුණු අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් 2019 පෙබරවාරි 08 දින වන විටත් එම ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සෝයා බෝංචි අවශ්‍යතාවය, සීමිත හා තරහකාරී ලංසු කැඳවීම් මත මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. 2016 ඔක්තෝබර් මාසයේ සිට 2018 පෙබරවාරි මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී සෝයා බෝංචි කිලෝ ග්‍රෑම් එකක් රු.110 කට සපයා ගෙන තිබුණු නමුත් සීමිත හා තරහකාරී මිල කැඳවීම් මත අවස්ථා 10 කදී සෝයා බෝංචි කිලෝ ග්‍රෑම් එකක් රු.128.60 සිට රු.137.60 ක් දක්වා වූ මිල ගණන්වලට මිලදී ගැනීමට සිදුවී තිබුණි.

(ඇ) ත්‍රිපෝෂ ඇසුරුම් කිරීම සඳහා අවශ්‍ය පොලිතින් බෑග් 10,000,000 ක් මිලදී ගැනීමේ ඇණවුම 2016 ජුනි 29 දින නිකුත් කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන විට ඇණවුම සපයා අවසන් කළ යුතුව තිබුණි. නමුත් විගණිත දිනය වූ 2019 පෙබරවාරි 07 වන විටත් මෙම ඇණවුම සම්පූර්ණ කර නොතිබුණු අතර, 2018 අප්‍රේල් 30 දින කල් ඉකුත්වී තිබුණු කාර්යය සාධන ඇපකරයේ වලංගු කාලය දීර්ඝ කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. ප්‍රමාද ගාස්තු පිළිබඳ කොන්දේසියක් ගිවිසුමට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගත නොහැකිවී තිබුණි.

(ඈ) 2017/2018 වර්ෂ සඳහා ත්‍රිපෝෂ ඇසුරුමට අවශ්‍ය ක්‍රාෆ්ට් පේපර් බෑග් 900,000 ක් අතරින් ක්‍රාෆ්ට් බෑග් 300,000 ක් සපයා ගැනීමේ ඇණවුම, ක්‍රාෆ්ට් බෑග් එකක් සඳහා රු.33.30 ක් වූ දෙවන අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරු වෙත, ප්‍රථම නොගය දින 05 ක් ඇතුළත සහ මුළු

තොගය මාස 03 ක් ඇතුළත සැපයිය යුතු වීමේ කොන්දේසිවලට යටත්ව නිකුත් කර තිබුණි. නමුත් දින 20 කට පසුව ඇණවුම කොටස් වශයෙන් සැපයීම සිදුකර තිබුණු අතර ඇණවුම් කර මාස තුනක් ඇතුළත දී ක්‍රාෆ්ට් බෑග් 146,700 ක් පමණක් සැපයුම් කර තිබුණි. නමුත් ප්‍රමාද ගාස්තු පිළිබඳ කොන්දේසියක් ගිවිසුමට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගත නොහැකිවී තිබුණි.

මාසික සාමාන්‍ය අවශ්‍යතාවය බෑග් 31,000 ත් 60,000 ත් අතර ප්‍රමාණයක් ගෙන තිබුණු බැවින්, ඉතිරි ක්‍රාෆ්ට් බෑග් 600,000 සපයා ගැනීමේ ඇණවුම, මාස තුනකට පසුව තොගය සැපයීමට ඉදිරිපත් වී තිබුණු, බෑග් එකක් සඳහා රු.28.32 ක අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරු වෙත පිරිනැමිය හැකිව තිබුණු නමුත්, ඒ වෙනුවට නැවත ලංසු කැඳවා තිබීම හේතුවෙන් බෑග් 300,000 සැපයූ සැපයුම්කරු වෙතින්ම එක් බෑගයක් රු.45.25 ක් වැනි වැඩි මිලකට මිලදී ගැනීමට සිදුවී තිබුණි. ඒ හේතුවෙන් වැයකර තිබුණු අතිරේක පිරිවැය රු.10,158,000 ක් විය.

03. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2018 වර්ෂයේ අවශ්‍යතාවය වූ කිරිපිටි මෙට්‍රික් ටොන් 600 ක් සපයා ගැනීමේ ප්‍රසම්පාදනය සඳහා කිරිපිටි කිලෝ ග්‍රෑම් එකකට රු.810 ක් වූ අවම ලංසුව මිල්කෝ සමාගම විසින් ඉදිරිපත් කර තිබුණි. එම ලංසුව වෙළඳපල මිලට වඩා ඉතා ඉහළ අගයක් ගන්නා බැවින් එම සමාගම සමඟ සාකච්ඡා කර මිල අඩුකර ගත යුතු බව අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. කිරිපිටි තොග වෙළඳපලේ සාමාන්‍ය මිල කිලෝ ග්‍රෑම් එකක් රු.690 ක් පමණ වුවද, කිලෝ ග්‍රෑම් එකක් රු.798 කට සපයා ගැනීමට මිල්කෝ සමාගම සමඟ එකඟවී තිබුණි.

කිරි පිටි කිලෝ ග්‍රෑම් එකක් සඳහා රු.12 කින් මිල අඩු කිරීමේ තීරණය සහිත ඇණවුම් ලිපිය 2018 අප්‍රේල් 18 දින දක්වා ප්‍රමාද වී මිල්කෝ සමාගම වෙත යවා තිබීම හේතුවෙන් 2018 පෙබරවාරි මාසයේ සිට ඉතිරිකර ගත හැකිව තිබුණු රු.1,055,100 ක මිල අඩු කිරීමේ වාසිය අහිමිවී තිබුණි.

(ආ) සේවකයින්ගේ කාර්යය සාධනය ඇගයීමකින් තොරව 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී රු.66,772,000 ක් දිරිදීමනා ලෙස ගෙවා තිබුණු අතර දිරිදීමනා ගණනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර මහාභාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වැඩි ධාරිතාවයකින් යුක්ත නව ඇඹරුම් යන්ත්‍රයක් මිලදී ගැනීමත් සමඟම තවදුරටත් භාවිතා කළ හැකි පිරිවැය රු.3,866,667 ක් වූ පැරණි ඇඹරුම් යන්ත්‍රය භාවිතයෙන් ඉවත් කර තිබුණි. එය විධිමත් පරිදි අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) අමුද්‍රව්‍ය තොග කළමනාකරණයට අදාළ අවම, උපරිම හා යලි ඇණවුම් තොග මට්ටම් ඇස්තමේන්තු කර නොතිබුණු බැවින් අමුද්‍රව්‍ය තොග මිලදී ගැනීම, ගබඩා කිරීම හා නිකුත් කිරීම විධිමත්ව සිදුකර නොතිබුණි.

(ඉ) ණයට විකුණුම්වලට පෙර මුදල් තැන්පතුවක් ඉදිරිපත් කළ යුතු බවට වූ කොන්දේසි ඇතුළත් අවබෝධතා ගිවිසුමකට ණයගැනියන් සමඟ එළඹිය යුතු වුවද, එවැනි ගිවිසුමකට එළඹීමකින් තොරව හා මුදල් තැන්පතුවක් ලබා නොගෙන සමාලෝචිත වර්ෂය තුළදී එක් ණයගැනියෙකු වෙත රු.10,329,790 ක ණයට විකුණුම් සිදුකර තිබුණි.

(ඊ) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය සියළු අමුද්‍රව්‍ය වියදම් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් දරන බැවින්, නිෂ්පාදන ක්‍රියාවලියෙන් ඉවත්කරන අපතය විකුණුම් ආදායම රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අපතය විකුණුම් ආදායම රු.22,558,357 ක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.

(උ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව සමාගම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සමාගම දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති